*Vidyodaya J. Soc. Sc., Vol. 7 1 & 2 1996, pp. 127 - 156*

# නූතන ලංකාවේ ජනවාර්ගික කලාපීය මතවාදය හා ජාත්‍යන්තර ව්‍යාපාර

***ඇස් බී හෙට්ටිආරච්චි විසිනි***

ලංකාවේ දෙමළ ජනතාවගේ අනන්‍යතාවය හා ඔවුන් වසන ප්‍රදේශ ඉන්දියාව සමග ඒකාබද්ධ කළ යුතුය යන අදහස මේ ශතවර්ෂය මුලදී ම ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් විසින් ඉදිරිපත් කරනු ලැබීය. ලංකාව හා ඉන්දියාව එක් පාලනයක් යටතේ තිබීමේ වැදගත්කම ආනන්ද කුමාරස්වාමි විසින් ද සටහන් කරනු ලැබිණ.(1) ලංකා පාර්ලිමේන්තුවෙන් කැඩී ගොස් ඉන්දියාව සමග එක්වීමට තම වර්ගයාට අයිතියක් ඇතැයි එස්.ජේ.වී. චෙල්වනායගම් පාර්ලිමේන්තුවේ දී ම කීවේය.(2) දෙමළ ඩයස්පෝරා මත පදනම් වූ ද්‍රවිඩස්තානයක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාව දෙමළ නායකයන් තුළ විය. තමිල්නාඩුවේ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයේ මහාචාර්ය දුරෙයප්පා එම වර්ෂයේදී ම මෙසේ කීවේය."ලංකාව දැනටමත් අර්ධ දෙමළ රටකි, එය ද්‍රවිඩස්තානය යටතට පත් වූ විට අපේ නිදහස් දෙමළ රාජ්‍යයට ලෝකයේ හොඳම වරාය වූ ත්‍රිකුණාමලය අයත් වනු ඇත".(3) එම ද්‍රවිඩස්තානයෙහි අගනුවර විය යුත්තේ ත්‍රිකුණාමලය යැයි ද ඒ අනුව ඊළාම්වාදිහු තීරණය කළහ.

බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබන විට ඉන්දියානු අර්ධද්වීපය හින්දුස්තානය, පකිස්තානය හා ද්‍රවිඩස්තානය වශයෙන් ජනවර්ග පදනම් කරගත් රාජ්‍යයන් තුනක් යටතේ පාලනය විය යුතුය යන අදහසක් තිබුණත් ද්‍රවිඩස්තානය පිහිටුවීම පිළිබඳ අදහසට මුළු දකුණු ඉන්දියාවෙන් වුව ද පූර්ණ සහයෝගයක් නොලැබිණ. ඊට හේතුව වූයේ දකුණු ඉන්දියාවේ වෙනත් ද්‍රවිඩ රාජ්‍යයන් ඊට සහයෝගය දැක්වීමට මැලිකමක් තමිල්නාඩුවේ දෙමළ දැඩි ආධිපත්‍යය නිසා පෙන්වීම ය. එහෙයින් ඉන්දු-තමිල්-ඊළාම් මතවාදය ඉදිරිපත් කරනු ලැබිණ.(4) මේ මතවාදය ජනතාව අතරට ගෙන යෑම සඳහා ආරම්භ කරන ලද ප්‍රබල සංවිධානයක් නම් ඉන්දු-ලංකා සමිති සම්මේලනයයි. 1978 දී පළ කළ ඉන්දු-තමිල් ඊළාම් රාජ්‍යයේ සිතියම මගින් එම රාජ්‍යයේ දේශසීමා පවා ලෝකයට හඳුන්වා දෙන ලදී.(සිතියම අංක 1) එම අදහසෙහි සාධාරණත්වය හෝ යෝග්‍යභාවය ඒත්තු ගැන්වීම සඳහා ඉදිරිපත් කළ හැකි පිළිගත හැකි හේතු සාධක නැතත් මුලු දකුණු ඉන්දියාවෙන් හෝ මධ්‍ය ආණ්ඩුවෙන් හෝ ඊට සහයෝගය ලැබී නැතත් ද්‍රවිඩස්තානය පිළිබඳ අදහස අතහැර දමා නැත. ඒ හැරුණු විට ඇතැම් විටක තම වාසිය පිණිස වැරදි ලෙස කරුණු විග්‍රහ කළ අවස්ථා ද ඇත.

ජවහල්ලාල් නේරු විසින් කළ ප්‍රකාශයක් විකෘති කිරීම ඊට එක් නිදසුනකි. ආසියා ශාන්තිකර කලාපය ඉදිරි කාලයෙහි ජාත්‍යන්තර කටයුතුවල දී මධ්‍යස්ථානය විය යුතුය යන මතය ගොඩ නැගීම සඳහා

කරුණු ඉදිරිපත් කළ අය අතර නේරුට හිමිවන්නේ ප්‍රධාන තැනකි. එම මධ්‍යස්ථානය ගොඩ නැගිය යුත්තේ ඉන්දියානු අර්ධද්වීපය වටාය යනු ද ඔහු විසින් ඉදිරිපත් කරන ලද අදහසක් විය. එහි දී ඔහු මෙසේ කිවේය. 'ඉන්දියානු සාගර කලාපයෙහි මෙන් ම මැද පෙරදිග දක්වා අග්නි දිග ආසියාවෙහි ද ආර්ථික හා දේශපාලන කටයුතුවල මධ්‍යස්ථානය වශයෙන් ඉන්දියාව වර්ධනය වෙයි. අනාගතයේ දී ලෝකයෙහි සීඝ්‍ර දියුණුවකට පත්වන ප්‍රදේශයක දේශපාලනමය වශයෙන් හා උපායමාර්ගික වශයෙන් ඉන්දියාවට වැදගත් තැනක් හිමිවෙයි. ඉන්දියානු සාගරයෙහි ඉන්දියාවට ආසන්නයෙහි පිහිටා ඇති ඉරානය, ඉරාකය, ඇෆ්ගනිස්තානය, ඉන්දියාව, ලංකාව, බුරුමය, මලයාසියාව, සියම, හා ජාවා ආදිය ඇතුලත් කලාපීය ඒකකයක් ඇතිවන්නේ නම් අද පවත්නා සුලු ජන කොටස්වල ප්‍රශ්න නිරාකරණය වනු ඇත. නොඑසේ නම් මුළුමනින් ම වෙනත් ආකාරයකට ඒවා දෙස බැලිය යුතු වනු ඇත'.[5] මේ කියමනේ ඇතැම් කොටස් එහි සන්දර්භයෙන් පිටට ගනිමින් තම අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනිම සඳහා පාවිච්චි කළ ඇතැම් ඊළාම් මතවාදීන් විසින් මහත්සි ගෙන ඇත්තේ එයින් ද්‍රවිඩස්තානයක් බිහිකිරීම පිළිබඳ අදහසත් එම ද්‍රවිඩස්තානය පිහිට වූ විට ලංකාවේ ඔවුන් කියන දෙමළ ප්‍රශ්නය විසඳෙන බවත් නේරු විසින් ද පිළිගත් බව පෙන්වා දීමට ය.[6] නේරු මෙයින් බලාපෙරොත්තු වූයේ අන්තිමේ දී ඉන්දියානු ව්‍යාප්තවාදය නව මුහුණුවරකට ගෙන ඒම බව සැබෑවකි. එහෙත් ඊළාම් මතවාදින් අදහසක් කළ දෙය නොවේ.

ඉන්දියාවේ හා ලංකාවේ එබඳු සන්ධානයක් පිළිබඳ අදහස 1978 දී මුරාජ් දේශායි ප්‍රතික්ෂේප කෙළේ ය.[7] එහෙත්, නොබෝදා පැවැති මැතිවරණයෙන් නැවතත් මහඇමැති වශයෙන් පත් වූ කරුණානිධි ලංකාවේ ඇතැම් දෙමළ නායකයන් විසින් ,හඳුන්වන ලද්දේ ඉන්දියාවේ දෙමළ ජනතාවගේ නායකයා හැටියට නොව ලෝක දෙමළ නායකයා වශයෙනි.[8] මෙයින් බලාපොරොත්තු වූයේ දෙමළ ජනතාව සඳහා එක නායකයෙකු සිටිය යුතු බව නැවත අවධාරණය කිරිම ය.

ශ්‍රී ලංකාව ඊළාමයක් කොට එය ද්‍රවිඩස්තානයේ කේන්ද්‍රස්ථානය බවට පත් කිරිම මිලියන අසූවකගේ දැඩි අපේක්ෂාවක් බැවින් එය පහසුවෙන් යටපත් කළ නොහැක්කක් බව අමතක නොකළ යුත්තකි. තම වර්ගයා පීඩනයට හසුවන බවත් ඊට ප්‍රධාන හේතුව තමනට රාජ්‍යයක් නොමැති වීම බවත් ඔවුහු විශ්වාස කරති. ආචාර්ය සී.ජේ. බාලචන්ද්‍රගේ[9] සභාපතිත්වය යටතේ ඉන්ටර්නැෂනල් ටැමිල් ඊළාම් රිසර්ච් කොන්ෆරන්ස් නමින් වූ ලෝක සම්මේලනයක් 1991 දී ඇමරිකාවේ ද ඊළඟ අවුරුද්දේ දී ලන්ඩනයේ දී ද පවත්වනු ලැබිණ. එහි තේමාව වූයේ 'ටැමිල් ඊළාම්-අ නේෂන් විතෞට් අ ස්ටේට්' යන්නයි.[10]

එහෙයින් එම රාජ්‍යය ලබා ගැනීම සඳහා ඔවුහු දේශිය අරගලයක් ගෙන යති. එය සාධාරණිකරණය කිරීම සඳහා ද, ඊට ආධාර ලබා ගැනිම සඳහා ද ජාත්‍යන්තර මතවාදයක් ගොඩනගති. මේ මතවාදී අරගලය අවුරුදු පණහක පමණ කලක් මුලුල්ලේ වර්ධනය වෙමින් පවති. මේ සඳහා

ජාත්‍යන්තර සාකච්ඡා හා සම්මන්ත්‍රණ රාජ්‍ය නොවන සංවිධානවල ආධාර යටතේ පවත්වති. ලිපිලේඛන පළකරන අතර මෙයට පටහැනි වන්නාවූ යම් සාධක ඇත්නම් ඒවා යටපත්කර දමති. නැතිනම් විනාශ කර දමති. ඉතා සූක්ෂ්ම අන්දමින් තම මතයට සම්බන්ධ ලිපි ලේඛන පාසැල් පොත්වලට පවා ඇතුල් කරති. ට්‍රැවෝර් හිග්ගින්බොට්ටම්ගේ සංස්කාරකත්වයෙන් කොලින් ෆෞන්ඩේෂන් ජ්‍යොග්‍රැපි කෝර්ස් යටතේ පළකොට ඇති 'ජ්‍යොග්‍රැපි ටුඩේ බුක් 2' නම් ග්‍රන්ථය මෙයට සාක්ෂි සපයයි. එහි පළකර ඇති සිතියම අද ලංකාව නොව ඊළාමය පිහිටුවීමට පසු ඇති වන ලංකාව ය. (සිතියම් අංක 2) වැරදිවලින් ද ගහණ වූ මෙම පොත කොළඹ ජාත්‍යන්තර පාසැලේ පරිහරණය කරනු ලැබේ. ඇතැම් ජාත්‍යන්තර ගුවන් සමාගම් මගින් පෙන්වනු ලබන වීඩියෝ දර්ශනවලට පවා මෙම සිතියම ඇතුල් කිරිමට ඔවුහු සමත් වී සිටිති.

මෙම මතවාදී ව්‍යාපාරයේ සන්ධිස්ථානයක් සේ දැක්විය හැකි වසරක් නම් 1951 ය. මේ අවුරුද්දේ දී ප්‍රකට අනුල්ලංඝනීය කරුණු තුනක් ඉදිරිපත් විය. මේවා නම් දෙමළ ජනතාව නිශ්චිත ජාතියක් බව, උතුරු හා නැගෙනහිර පළාත් ඔවුන්ගේ නිජබිම බව හා එහි ඔවුනට රාජයක් තිබිය යුතු බව ය. ඊළඟ වැදගත් අවස්ථාවක් වුයේ 1976 වඩුක්කොඩ්ඩෙයි (වඩුගොඩ) සම්මේලනයයි. එහි දී පිළිගත් ප්‍රතිපත්ති අනුව සකස් කළ 1977 දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ මැතිවරණ ප්‍රකාශනයෙහි ඊළාම් (ලංකා රාජ්‍යයක්) සඳහා යන කොටසෙහි මෙසේ සඳහන් වෙයි. 'පාලනය කරන ජාතියේ සහ රජයේ ආරක්ෂක හමුදාවන්ගේ අනුබලය පිට සිංහල මැරවරයන් විසින් ද්‍රවිඩ ජනතාව කොල්ලකා මරා දමන සහ පහරදීම්වලට ගොදුරු වන විට... විනාශයේ පාමුලට තල්ලු වී සිටින්නා වූ ද්‍රවිඩ ජනතාවට... අවසාන වශයෙනුත් ස්ථිර වශයෙනුත් අප විසින් ප්‍රකාශයට පත්කළ යුතු එකම විසඳුම මෙයයි: අපේ මුතුන් මිත්තන් විසින් පාලනය කරනු ලැබූ මේ දේශය පාලනය කළ යුත්තේ අප විසින් පමණය. සිංහල අධිරාජ්‍යවාදීන් අපේ මාතෘභූමියෙන් පිටවී යා යුතුය'.

මේ කයෝර්ර සාවද්‍ය ප්‍රකාශය දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ විසින් කරන ලද්දේ ඡන්ද ගුණ්ඩුවක් වශයෙනි. එහි ප්‍රතිඵල තිබිණ.

රටේ තත්ත්වය තවදුරටත් නරක අතට හරවා ඊළාම් මතවාදය ගොඩනගමින් ඊළාමය දිනා ගැනිම සඳහා මේ කටයුතු කෙරෙද්දී ලංකා රජය විසින් දැක්වූ ප්‍රතිචාරය උදාසීන විය. අනිත් අතට මෙරට මාක්ස්වාදී ව්‍යාපාර විසින් මේ මතවාදය පිළිගන්නා ලද අතර එය ක්‍රියාත්මක කිරිම සඳහා උපකාර කරනු ලැබිණ. ඒ අතර මාක්ස්වාදීහු සිංහලයින්ගේ අනන්‍යතාවට හා ඔවුන්ගේ විශ්වාසවලට පහර ගැසූහ. 1987 නවදිල්ලියේ පැවැති සම්මේලනයක දී, උදාහරණයක් වශයෙන්, ආචාර්ය කුමාරි ජයවර්ධන (ඇය ත්‍රිපිටකය සිංහලට පෙරලා බුදුදහම ව්‍යාප්ත කළ දිවංගත ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය යි. මිථ්‍යා තුනක් ගැන කථා කළා ය. ඒවා මෙසේ ය.. ආර්ය වර්ගයා හා එම වර්ගයාට සිංහල

ජනයා අයත් බව, විජයගේ ලංකා සම්ප්‍රාප්තිය හා සිංහල ජාතියේ ආරම්භය අතර පවතින සම්බන්ධතාව හා ධර්මද්වීප සංකල්පය, බුදුන් වහන්සේගේ ලංකාගමනය හා ලංකාව සමග උන්වහන්සේ පැවැත්වූ විශේෂ සම්බන්ධතාව ය.

ඊළාම් ජාත්‍යන්තර ව්‍යාපාරය අද පවත්නා තත්ත්වයට විකාශනය වීමේ ඓතිහාසික වකවානු කිපයක් ඇති බව පෙනේ: (1) 1947-1971, (2) 1972-1976, (3)1977-1983, (4) 1984-1991, (5) 1992 සිට අද දක්වා.

(1) 1947-1971

1947 සිට 1971 දක්වාවූ වකවානුව තුළ දක්නට ලැබෙන උප කාලපරිච්ඡේදයක් වශයෙන් 1947-1956 දක්වා කාලය ගත හැකිය. දෙමළ ජනතාව සඳහා ලංකාව තුළ වෙන ම පාලනයක් තිබිය යුතුය යන සංකල්පය මේ කාලයේදී තමිල්නාඩුවේ සාකච්ඡාවට භාජනය වූ බැව් පෙනේ. මේ කාලය තුළ වූ අමාත්‍ය මණ්ඩලවල මනා දෙමළ නියෝජනයක් තිබීමත් ඔවුන්ගේ අසීමිත නියෝජනයක් රාජ්‍ය සේවය තුළ තිබීමත් භාෂා ප්‍රශ්නයක් නොතිබීමත් යන කරුණු ඔවුනට උග්‍ර ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගෙන යාමට අවශ්‍ය වාතාවරණය සකස්කර නොදුන් බව පෙනේ. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ජී.ජී. පොන්නම්බලම් හඳුන්වා දුන්නේ සිංහලයින් දෙසට හුලං හැමීමක් වශයෙනි.[11] සර්වජන ඡන්ද බලය හිමිවීමෙන් සිංහල බහුතරයක් තේරීම් කාරක සභාවලට පත්වීම නිසා ඔහු මෙය පැවැසී ය. මෙයින් පැහැදිලි වන්නේ සිංහල බහුතරය බහුතරයක් වශයෙන් පිළිගැනීමට ඔවුන් තුළ වූ අකමැත්ත ය. එය ඇත්ත වශයෙන් ම ප්‍රජාතන්ත්‍ර විරෝධි අදහසකි. 1931 දී පවත්වන ලද රාජ්‍යසභා මැතිවරණය යාපන ජනතාව ලවා බලෙන් ප්‍රතික්ෂේප කරවන ලදී. එහිදී දෙමළ දේශපාලන නායකයින් කියා සිටියේ මහජන නියෝජිතයිනට දෙන ලද බලතල තම ජාතියේ අභිප්‍රායන්ට වඩා අඩු ඒවා බව ය. එහෙත්, අනිත් ප්‍රදේශයන්හි දෙමළ ජනතාව මැතිවරණයට සහභාගි වූහ. මේ අනුව, පළමුවන රාජ්‍ය මන්ත්‍රණ සභාවට ලාංකික දෙමළ තිදෙනෙකු ද ඉන්දියානු දෙමළ දෙදෙනෙකුද තේරි පත්වූ අතර හැටන් ආසනයෙන් තේරි පත්වූ පෙරියසුන්දරම් කම්කරු කර්මාන්ත හා වෙළෙඳ ඇමති ධුරයට තේරී පත් විය. හත් දෙනෙකුගෙන් සමන්විත වූ ඇමති මණ්ඩලයෙහි ඉතිරි සය දෙනාගෙන් පස් දෙනෙක් සිංහල ද එක් අයෙක් මුස්ලිම් ද වූහ.

1936 දී පැවැත් වූ දෙවන රාජ්‍යසභා මැතිවරණයේ දී ලාංකික දෙමළ අට දෙනෙක් ද ඉන්දියන් දෙමළ දෙදෙනෙක් ද තේරි පත්වූහ. එම ඇමති මණ්ඩලයෙහි දෙමළ නියෝජනයක් නොතිබුණ ද කථානායකවරයා ඩබ්ලිව්. දොරේසාමි නම් වූ දෙමළ මන්ත්‍රිවරයෙක් විය. කථානායක ධුරය සඳහා තරඟ කළ ජ්‍යෙෂ්ඨ සිංහල දේශපාලනඥයෙකු වූ ෆ්‍රැන්සිස් ද සොයිසා පරාජය කොට සිංහල බහුතරයක් විසින් දෙමළ මන්ත්‍රිවරයෙකු තෝරා පත්කර ගැනීම සිංහලයින් ජාතිභේදවාදී දේශපාලනය ප්‍රතික්ෂේප කිරීම හුවා

දක්වයි. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මහකොමසාරිස් වශයෙන් පත්වී 1942 දී ඉන්දියාවට යෑම නිසා පුරප්පාඩු වූ ස්වදේශ කටයුතු භාර අමාත්‍ය ධුරයට මහාමාන්‍ය ඩී.ඇස්. සේනානායක විසින් පත්කරනු ලැබුවේ අරුණාචලම් මහාදේව ය. 1947 දී පත්වූ අමාත්‍ය මණ්ඩලයේ සී.සිත්තම්පලම්, සී. සුන්දරලිංගම් හා ජී.ජී. පොන්නම්බලම් යන දෙමළ ඇමතිවරුන් තිදෙනෙක් සිටියහ. මේ දක්වා මතභේදයකින් තොරව සමස්ත ලංකා දෙමළ කොංග්‍රසය රජයේ සිටියත් 1949 දී ගෙන ආ ඉන්දියානු හා පකිස්තානු වැසියන්ගේ (පුරවැසි) පනත නිසා ඇස්. ජේ. වී. චෙල්වනායගම් හා වන්නියාසිංහම් ද කොංග්‍රසයෙන් ඉල්ලා අස්වූහ. සී සුන්දරලිංගම් ද ඇමති ධුරයෙන් ඉල්ලා අස්විය. එසේ ද වුවත්, ලාංකික දෙමළ මන්ත්‍රීවරුන් එකොළොස් දෙනාගෙන් අට දෙනෙක් ද ඉන්දියානු දෙමළ කොංග්‍රසයේ[12] මන්ත්‍රීවරුන් හත් දෙනා ද වාමාංශික සිංහල මන්ත්‍රීවරුන් විසි දෙනෙක් ද පනතට විරුද්ධව ඡන්දය දුන්හ. ඉන්දිය වතු දෙමළ කම්කරුවන්ට මේ පනත නිසා ඡන්දය පාවිච්චි කළ නොහැකි විය. ඔවුන් ලංකාවේ පුරවැසියන් නොවූ බැවින් ඔවුනට ඇත්ත වශයෙන් ම, ඡන්ද බලයක් තිබුනේ නැත. එහෙයින් ඔවුන්ට තිබූ ඡන්ද බලය මේ පනත මගින් අහෝසි කළායැයි කිවහොත් එය වැරදි ය.

1949 දී චෙල්වනායගම් විසින් දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවිය.[13] 1952 දී පැවැත්වූ දෙවන පාර්ලිමේන්තු මැතිවරණයේ දී චෙල්වනායගම් තම පක්ෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත සඳහා අපේක්ෂකයන් ඉදිරිපත් කළේ ය. එක්සත් ජාතික පක්ෂය හා දෙමළ කොංග්‍රසය එක්ව අපේක්ෂකයන් ඉදිරිපත් කළේ ය. චෙල්වනායගම් ද එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයාට පරාජය විය. යාපන අර්ධද්වීපයේ ආසන හතෙන් පහක් එක්සත් ජාතික පක්ෂය දිනාගත්තේ ය. වන්නියාසිංහම් ජයග්‍රහණය කළේ ය. එහෙත් වැඩි ඡන්ද දෙසීයකින් පමණි. පොන්නම්බලම් ඇමතිවරයෙකු වශයෙන් ඩඩ්ලි සේනානායක අමාත්‍ය මණ්ඩලයේ ද කොතලාවල අමාත්‍ය මණ්ඩලයේ ද දිගට ම සේවය කළේය.

1956 දී මෙම තත්ත්වය වෙනස් විය. එක් අතකින් අමාත්‍ය මණ්ඩලයේ කිසිදු දෙමළ නියෝජනයක් නොවී ය. අනිත් අතට සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම සඳහා නීති ගෙන ඒම නිවැරිදි ක්‍රියාවක් වුව ද එය දෙමළ නායකයින්ට තම ව්‍යාපාරය ප්‍රබල අන්දමින් ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ගෙන යාම සඳහා උපයෝගි කරගත හැකි කරුණක් විය. මෙම නීති ක්‍රියාවට නැගීමේ දී මෙතෙක් විශේෂ වරප්‍රසාද භුක්ති විඳගෙන ආ දෙමළ ප්‍රභූ පන්තියට ඔවුන්ගේ කටයුතු රාජ්‍ය භාෂාවෙන් කරගෙන යාම දුෂ්කර විය. එහෙයින් ඔවුන්ගෙන් වැඩි දෙනෙක් දිවයින හැර ගියහ. එසේ ගියවුන් අතර දොස්තරවරුන් ඉංජිනේරුවරුන් හා නීතිඥයන් වැනි වෘත්තිකයින් වැඩි පිරිසක් සිටියහ. වැඩි දෙනා ක්‍රිස්තියානි භක්තිකයෝ වූහ. ආර්ථික වශයෙන් මෙන් ම, සාමාජික වශයෙන් ද ශක්තිමත් වූ ඔවුනට දෙමළ ප්‍රචාරක කටයුතු විදේශයන්හි කරගෙන යෑම සඳහා මනා පසුබිමක්

තිබිණ. සිංහල බෞද්ධ බහුතරය විසින් ක්‍රිස්තියානි දෙමළ සුළු කොටසකට හිරිහැර කරන බව ප්‍රචාරය කරමින් තම ක්‍රිස්තියානි සහෝදර වෘත්තිකයින් මෙන් ම ක්‍රිස්තියානි පූජකවරුන් ද මානව අයිතිවාසිකම් පිළිබඳව වූ සංවිධාන ද තම ව්‍යාපාරය දෙසට හරවා ගැනිමට ඔවුහු සමත් වූහ. ඔවුන් තම වාසියට හරවා ගත් තවත් කරුණක් වූයේ තම නායකයා එනම්, චෙල්වනායගම් ක්‍රිස්තියානි භක්තිකයෙකු වීම ය.

1963 දී එංගලන්තයේ රාජනීතිඥ ශ්‍රීමත් ජෝන් ෆෝස්ටර් විසින් පිළියෙල කොට එංගලන්තයේ මහරජුට යවන ලද සන්දේශ මගින් ඊළාමය ඉල්ලීමේ සාධාරණත්වය කියා සිටියේය. මෙම ව්‍යාපාරයේ දී ඔහු හා එක් වූ අවශේෂ අය ඩේවිඩ් ඇස්ටර්, රොබට් බර්ලි, ජී මයිකල් ස්කොට් පියතුමා, (1983 දී අභාවප්‍රාප්ත විය) ලුවිස් බ්ලොම්කූපර්, ජේම්ස් ෆෝසෙත් සහ ඩිංගල් ෆුට් ය. මෙම කණ්ඩායම 1976 ජනවාරි මාසයේ දී හා 1977 සැප්තැම්බර් මස 20 වන දින ද ටයිම්ස් (ලංඩන්) පුවත්පතේ කතෘට ලිපි සපයමින් සිංහලයින් විසින් දෙමළ ජනතාව විනාශ කරන හෙයින් ඔවුන් විසින් ඉල්ලා සිටින ඔවුනට නැතිවුණ රාජ්‍යය නැවත ලබාදීමට එංගලන්තය බැඳී සිටින බව කියා සිටියහ. තවද සිංහලයින් විසින් දෙමළ ජනතාව දිගින් දිගට ම පෙළන බවට අසත්‍ය ප්‍රචාර කරමින් ලංකාවට බ්‍රිතාන්‍ය රජයෙන් මෙන් ම ලෝකයෙන් ද ආර්ථික සම්බාධ පැනවිය යුතු යයි ද කියා සිටියහ. මේ සඳහා ඔවුන් බෙහෙවින් උනන්දු කරවන ලද්දේ කේ. වෛකුණ්ඨවාසන්ය.[14]

1965 දී හින්දි භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් තමිල්නාඩුවට හඳුන්වා දීම නිසා එහි උද්ඝෝෂණ ව්‍යාපාර ආරම්භ විය. එයට ඇත්ත වශයෙන් ම, බලපෑවේ තමිල්නාඩුවේ ආධාර මත එවකට උග්‍රවී තිබුණ ලංකාවේ උද්ඝෝෂණ ව්‍යාපාරය යි. පසුව අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් ඇති විය. එවකට තමිල්නාඩුවේ බලයේ සිටියේ සමස්ත ඉන්දියා අන්නාදුරේ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය යි. එම පක්ෂයෙහි විදුලිබල අමාත්‍ය එස්. රාමචන්ද්‍රන් කියා සිටියේ හින්දි භාෂාව තමිල්නාඩුවට බලෙන් පැටවීම ලංකාවේ උද්ගතවී ඇති තත්ත්වයට සමාන තත්ත්වයක් එහි ද ඇතිවීමට හේතු විය හැකි බවත් ලංකාවේ දෙමළ ජනයාට සිංහල භාෂාව බලෙන් පැටවීම එහි බෙදුම්වාදයක් හට ගැනීමට අතිශයින් බලපා ඇති බවත් ය.[15] තමිල්නාඩුවට මෙම තර්ජනය එන බව දැනගත් ඔවුහු ඊට කලින් ලංකාවේ උග්‍ර ප්‍රශ්න ඇතිකොට එහි අසීරු තත්ත්වයක් ඇති කළහ.

(2) 1972-1976

1972 සිට 1976 දක්වා කාලය තුළදී ඊළාම් මතවාදය න්‍යායාත්මක ලෙස ගොඩනගන ලද අතර එම මතවාදය ක්‍රියාවට නැංවීමේ කේන්ද්‍රස්ථානය බවට තමිල්නාඩුව පත්විය. මේ නිසා යාපනය-මද්‍රාසිය පදනම් කොට ගත් ප්‍රචාරක ජාලයක් බිහි විය. 19.2.1972 දින චෙල්වනායගම් සහ

අමිර්තලිංගම් දකුණු ඉන්දියාවට ගියහ. එම ගමනේ අරමුණ වූයේ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයේ මැතිවරණ කටයුතුවලට සහායවීම ය. එහි දී චෙල්වනායගම් මෙසේ කීවේ ය. 'සම්පූර්ණ වූ ද ස්වාධීන වූ ද රාජ්‍යයක් සඳහා අපි සටන් කරන්නෙමු. ශ්‍රී ලංකාවෙහි වෙන ම රාජ්‍යයක් අපි ඉල්ලා සිටින්නෙමු. මේ සඳහා තමිල්නාඩු වැසියන්ගේ පමණක් නොව සමස්ත ඉන්දීය ජනතාවගේ ම සහයෝගය අපට අවශ්‍ය වන්නේ ය'.[16] චෙල්වනායගම්ගේ නායකත්වයට අමතරව ගරිල්ලා සටන් ව්‍යාපාරයක ප්‍රභවය ද මේ කාලය තුළ සිදු විය. 1972 දී දෙමළ තරුණයින් දහදෙනෙකුට විරුද්ධව යාපන මහේස්ත්‍රාත් උසාවියේ නඩුවක් විය. (අංක 49193) එම නඩුව පවරණ ලද්දේ එවකට තැපැල් සහ විදුලි සන්දේශ ඇමැති වූ චෙල්ලය්යා කුමාරසූරියර්[17] ඝාතනය කිරීමට තැත් කිරීම හේතුවෙනි. එයින් කීප දෙනෙකු හදිසි කරුණක් වශයෙන් සලකා දේශපාලන මැදිහත්වීම උඩ නිදහස් කරනු ලැබීය. එම හදිසි කරුණ කරුණ නම් (1972 ජනරජ ව්‍යවස්ථාවට අභියෝග කරමින්) එස්. ජේ. වී. චෙල්වනායගම් තමා නියෝජනය කළ කන්කසන්තුරේ ආසනයෙන් ඉල්ලා අස්වීම නිසා හටගත් අතුරු මැතිවරණය යි.

එම මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යාපන නගරාධිපති වූ ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා ද අපේක්ෂයෙකු විය. අගමැති සිරිමා බණ්ඩාරනායකගෙන් ඔහු ඉල්ලා සිටියේ අත් අඩංගුවේ සිටින සියලු දේශපාලන රැඳවුම්කරුවන් නිදහස් කරන ලෙස ය. මැතිවරණය ජයගැනීමට එය රුකුලක් වන බව ඇය සිතූ නිසා ඔවුන් සියලු දෙනා ම නිදහස් කරන ලදී. දේශපාලන වාසි සඳහා නීතිය හෑල්ලු කිරීමකට වඩා මෙහි ප්‍රතිපල භයානක විය. අද බරපතල ප්‍රශ්නය වන ත්‍රස්තවාදී සංවිධාන කිහිපයක් ම එසේ නිදහස් වූවන් විසින් අරඹන ලද බැවිනි. ඒවා නම්, ද ටැමිල් නිව් ටයිගර්ස් (ටී. ඇන්. ටී.), ද ටැමිල් ඊළාම් ලිබරේෂන් ඕගනයිසේෂන් (ටෙලෝ) හා ද ලිබරේෂන් ටයිගර්ස් ඔෆ් ටැමිල් ඊළාම් (එල්ටීටීඊ) ය. මේවායේ ආරම්භක සාමාජිකයෝ දෙමළ ශිෂ්‍ය ව්‍යාපාරයෙන් (තමිල් මනවාර් පෙරවි) කැඩී ගිය අය වූහ. දෙමළ ත්‍රස්තවාදී ක්‍රියා ඇත්ත වශයෙන්ම ප්‍රථමවරට ආරම්භ කරන ලද්දේ එම ශිෂ්‍ය ව්‍යාපාරය විසිනි. 1971 දී දොරේඅප්පාගේ නිවසට බෝම්බ ගැසීමෙන් එය එළියට ආවේය. එම ව්‍යාපාරයේ නායකයා වූයේ පී. සත්‍යසීලන් ය. ඔහුගේ ව්‍යාපාරය ළදරු අවදියක පැවැති බැවින් තමිල්නාඩුව සමග සම්බන්ධතා පැවැත්වීමට ඔහුට ඉඩක් තිබූ බැව් නොපෙනේ. එසේද වුවත්, ඉහත සඳහන් සංවිධානවල මූලස්ථානය වූයේ තමිල්නාඩුවයි. ඔවුන්ගේ පුහුණු කඳවුරු තිබුණේ එහි බව මුලදී රජයේ ඇතැම් කොටස් නොපිළිගත්ත ද එය සැබෑවක් බව පසුව පැහැදිලි විය. මේ කාලයෙහි ඉන්දීය මධ්‍ය රජයේ තිබූ දෙබිඩි පිළිවෙත නිසා ප්‍රශ්නය ඉතා ව්‍යාකූල විය. තමිල්නාඩුවේ 'අපි දෙමළ' සංවිධානය මගින්

ලාංකික ත්‍රස්තවාදීන්ට දෙන ලද සහාය අතිවිශාල ය. දෙමළ රාජ්‍යයක් පිහිටුවා දෙමළ කොඩිය ඔසවා දෙමළ ජාතික ගීය ගායනා කරවීම තුළින් දෙමළ අනන්‍යතාව සුරක්ෂිත කරවීම අපි දෙමළු සංවිධානයෙහි අරමුණ විය.

මේ අනුව, ලංකා දෙමළ ත්‍රස්තවාදීහු තමිල්නාඩුව හා ඉතා සමීප සම්බන්ධතා පවත්වමින් ආයුධ රැස්කිරීම් ආදී කටයුතුවල නිරත වූ අතර භීෂණ ක්‍රියා දිගින් දිගටම සිදු කළහ. එහි ඉතා දරුණු තත්ත්වයක් 1975 දී දොරේඅප්පා ඝාතනයෙන් පෙනේ. එවැනි සාහසික ක්‍රියා17 ක් පමණ 1971 සිට 1977 දක්වා සිදුවී තිබිණ. [18] මෙම ව්‍යාපාරයට රුකුල් ලැබුණ තවත් දේශපාලන සංවර්ධනයක් මේ කාලය තුල දක්නට ලැබිණ. 1971 දී දෙමළ එක්සත් පෙරමුණ වැල්වැටිතුරේ දී පිහිටුවා ගැනීමත් එය ජාත්‍යන්තරයට උචිත පරිද්දෙන් (ත්‍රිකුණාමලයේ දී) දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ යනුවෙන් 1976 දී නම් කිරීමත් එම වර්ෂයේ දී ම වඩුක්කොඩ්ඩෙයි සම්මේලනයේ දී ද්‍රවිඩ ජනතාවට දුන් පොරොන්දුත් මේ අතර විය. මේ අදහස් පහසුවෙන් ලෝකයට ගෙන යාමට උදවු වූ වැදගත් සිදුවීමක් වූයේ 1977 දී අමිර්තලිංගම් විපක්ෂ නායක ධූරයට පත් වීමයි.

චෙල්වනායගම් 1972 දී තම අසුනෙන් ඉල්ලා අස්වුවත් අතුරු මැතිවරණය පවත්වන ලද්දේ 1975 පෙබරවාරි මාසයේ දී ය. මැතිවරණය කල් දැමීම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක් හැටියට ලෝක සංවිධාන විසින් හුවා දැක්වීම අසාධාරණ නොවේ. දොරේඅප්පා තරඟයට ඉදිරිපත් නොවී ය. ඊට හේතුව වූයේ ඔහුට ඉහත සඳහන් කණ්ඩායම්වලින් තිබූ තර්ජනය. (1975.7.27 දින ඔහු ඝාතනය කරනු ලැබිණ.) බලාපොරොත්තු විය හැකි පරිදි ම අතුරු මැතිවරණයෙන් චෙල්වනායගම්ට අතිවිශිෂ්ඨ ජයක් ලැබිණ. ඔහුට ඡන්ද 25,927 ක් ලැබුණ අතර ඔහුගේ ප්‍රතිවාදියා වූ කොමියුනිස්ට් පක්ෂයේ වී. පොන්නම්බලම්ට ලැබුණේ ඡන්ද 9457 ක් පමණි. 1970 දී චෙල්වනායගම්ට ලැබුණේ ඡන්ද 13,520 ක් පමණි. පොන්නම්බලම්ට 8164 ක් ලැබුණි. මේ නිසා යථෝක්ත හිරකරුවන් නිදහස් කිරීමෙන් බලාපොරොත්තු වූ දේශපාලන වාසිය හෝ රජයට ලැබුණේ නැත. චෙල්වනායගම්ගේ මෙම ජයග්‍රහණය දෙමළ ජාත්‍යන්තර ව්‍යාපාරයට ද මහත් රුකුලක් විය.

මේ කාලයේ දී දෙමළ සංවිධාන කීපයක් එංගලන්තයේ බිහිවිය. 1977 දී පහළ වූ ස්ටෑන්ඩිං කොමිටි ඔෆ් ටැමිල් පීපල් (ස්කොට්) ඉන් එකකි. එහි ආරම්භක සභාපති වූයේ දොස්තර කනපතිපිල්ලේ අරුමුගම් ය. මෙම සංවිධානය රජය පිළිගත් පුණ්‍යායතනයක් (2744997) ද වීමෙන් එවැනි සංවිධානවලට එංගලන්තය දැක් වූ අනුග්‍රහය පැහැදිලි වේ. තව ද, රජයේ ලිපිකරු සේවා සංගමයේ මහලේකම්ව සිටි කේ.වෛකුණ්ඨවාසන් 1971 දී දිවයින හැරගොස් සැම්බියාවේ නීති ක්ෂේත්‍රයේ රැකියාවක නියුක්ත විය. එහි දී ඔහු වැඩිපුර කාලය ගත කෙළේ දෙමළ ඊළාමය පිළිබඳ අදහස

විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා ය. 1975 වන විට සැම්බියාවේ දෙමළ පවුල් 300 ක් පමණ විය.[19] මේ කාලය වනවිට එංගලන්තයේ දෙමළ සංවිධානවලට අමතරව ලන්ඩන් කොමිටි ඔෆ් ෆ්‍රෙන්ඩ්ස් ඔෆ් ටැමිල්ස් නම් සංවිධානයක් ඩේවිඩ් ඇස්ට්‍රගේ මූලිකත්වයෙන් පිහිටුවා තිබිණ. එම සංවිධානය විසින් දෙමළ ආරක්ෂක අරමුදලක් ද පිහිටුවා තිබූ අතර වෛකුණ්ඨවාසන් සැම්බියාවෙන් මුදල් එකතු කර එයට එව්වේ ය.[20]

(3) 1977-1983

1975 පැවැත්වීමට නියමිතව තිබූ මහමැතිවරණය පවත්වන ලද්දේ 1977 දී ය. මේ කාලය තුළ මතවාදී වශයෙන් ද ප්‍රායෝගික වශයෙන් ද විධිමත් සේ සංවිධානය වූ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ එම මැතිවරණ ප්‍රතිඵල අනුව ඉතිහාසයෙහි ප්‍රථමවරට විරුද්ධ පක්ෂයේ නායකත්වය දිනා ගැනීමට සමත් විය. මේ අනුව විරුද්ධ පක්ෂයේ නායකයා බවට පත් වූ ඒ. අමිර්තලිංගම් වැඩි වශයෙන් කරන ලද්දේ ජාත්‍යන්තර ඊළාම් ප්‍රචාරය යි. එහෙයින් ඔහු ජාත්‍යන්තර ඊළාම් ප්‍රචාරකයා වශයෙන් හඳුන්වනු ලැබිණ. ඔහු විසින් කමිටු කිපයක් මේ සඳහා පිහිටුවා තිබූ අතර ඒවා මගින් අදාළ කලාපීය කටයුතු ද එම කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය අවශ්‍යතා හා අවශෙෂ පහසුකම් ද සලසනු ලැබිණ. මේ කාර්යයන් පෞද්ගලිකව සොයා බැලීම සඳහා ඒ ඒ රටවලට යෑමට අවශ්‍ය පහසුකම් මෙන් පිළිගැනීම ද විරුද්ධ පක්ෂයේ නායක වශයෙන් ඔහුට තිබීම ඊළාම් ව්‍යාපාරයට ලැබුණ විශේෂ ආධාරයක් විය.

ස්වාධීන රාජ්‍යයක් තම ජනතාවට ලබා දෙන බවට දුන් පොරොන්දුවට පැහැදිලි ජනවරමක් ලැබී ඇති නිසා එය ඉටු කිරීමට තමන් බැඳී සිටින බව ස්වාධීන රාජ්‍යය පිළිබඳව අනුකූලතාව දැක්වූ විදේශීය සංවිධානවලට මේ තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් දැන් වූ ඔහු පුද්ගලිකව එම සංවිධාන හමුවීමට ද අවස්ථාව සලසා ගත්තේ ය. ඊළාම්වාදීන් කෙතරම් ජයග්‍රහණයක් මේ කාලය තුළ ලැබුවාද යන්න 1983-84 වර්ෂවල දී උතුරු ඉන්දියාවේ පමණක් ගරිල්ලා පුහුණු මධ්‍යස්ථාන අටක් විය. (සටහන බලන්න) 1978. 10. 5. වන දින එක්සත් ජාතීන්ගේ සම්මේලනය අමතා බලෙන් කථාකිරීමට ඔවුහු එඩිතර වූහ. එවකට විදේශ ඇමතිවරයාව සිටි ඒ.සී.ඇස්.හමීඩ් මහතාගේ නම නිවේදනය කළ විට වෛකුණ්ඨවාසන් වේදිකාවට කඩා පැන කථා කිරීමට පටන් ගත්තේ ය. එය ද ශිෂ්ට ලෝකය විසින් ත්‍රස්තවාදී ක්‍රියාවක් ලෙස සැලකුව ද ඔහු විසින් කියන ලද දේ සැලසුම් කොට තිබූ පරිදි ම ජනමාධ්‍ය මගින් ප්‍රචාරය කෙරිණ.[21] මේ කටයුතු වැඩි ප්‍රමාණයක් සංවිධානය කරනු ලැබුවේ දෙමළ සම්බන්ධීකරණ කමිටුව විසිනි. බ්‍රිතාන්‍යයෙහි පිහිටුවා තිබූ ඊළාම් ටැමිල් ඇසෝෂියේෂන්, ඉලංකෙ තමිල් සංගම්, ඉන්දු හා සිලෝන් ෆෙඩරේෂන් මුව්මන්ට් ආදි සංගම් ඒ කමිටුවේ විය. මේ කටයුතු නිසා 1979 මැයි 9 දා මැසචුසෙට්ස් පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලැබූ ලංකාවේ පවතින දෙමළ පීඩනය

පිළිබඳ යෝජනාව ඇමරිකා ජනාධිපතිගේ අවධානයට යොමු කෙරිණ. එසේම දෙමළ ඊළාම් ප්‍රකාශය එහි ආණ්ඩුකාර එඩ්වඩ් ජේ.කිං ප්‍රකාශයට පත් කෙළේ ය. 1979 අගෝස්තු මස 14 වන දින දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ විදේශයන්හි සිටින ඊළාම් දෙමළ ජනතාවගෙන් දෙමළ සම්බන්ධීකරණ කමිටුවට බැඳෙන ලෙස ඉල්ලා සිටියේ ය. 1979 දී ඉන්දිරා ගාන්ධි මැතිණියට සන්දේශයක් යැවූ වෛකුණ්ඨවාසන් දෙමළ ජනයාට ලංකාවේ අසාධාරණයක් සිදුවන බව කියා සිටියේ ය. එයට එතුමිය එවූ පිළිතුරෙන් කියා සිටියේ ශ්‍රී ලංකා රජය හා තමන් කිට්ටු මිතුරන් වුව ද, දෙමළ දුක් ගැනවිලි ගැන තම පක්ෂයට මේ අවස්ථාවේ දී සලකා බැලිය හැකි ද යන්න පිළිබඳව තමනට සැක ඇති බව ය.(22)

මෙම ප්‍රචාරක කටයුතු සඳහා බීබීසී ආදියෙන් ද ප්‍රචාරයක් දෙනු ලැබිණ. මේ වර්ෂයේ දී ම ලන්ඩනයේ පිහිටුවාගෙන තිබූ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කණ්ඩායමක් මගින් සිත් ඇද ගන්නා සුළු දැන්වීම් ප්‍රසිද්ධ පුවත්පත්වල සහ සඟරාවල පළ කරනු ලැබිණ. එවැනි එක් දැන්වීමක සිරස්තලය වූයේ සම් මයිනෝරිටීස් නීඩ් යූ ටු ස්ටෑන්ඩ් යන්නයි. ලෝක ළමා දිනය වෙනුවෙන් පළ කළ දැන්වීමක් මගින් දෙමළ සරණාගතයින් පුනරුත්ථාපනය කිරීමේ බ්‍රිතාන්‍ය මධ්‍යම අරමුදලට ආධාර ඉල්ලා සිටිනු ලැබිණ. නිදහස සඳහා යනුවෙන් පළ කරනු ලැබූ පෝස්ටරයක් මගින් දෙමළ ඊළාම් ජාතික ආරක්ෂක අරමුදලට ආධාර ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් ද දියත් කොට තිබිණ

මේ කාලයේ දි දකුණු ඉන්දියාවේ අවශේෂ ද්‍රවිඩ ජනතාව ඊළාම් ව්‍යාපාරය දෙසට නම්වා ගැනීමේ ප්‍රයත්නයක යෙදෙන අයුරු ද පෙනි යයි. ඒ සඳහා ඊළාම් වාදීන් විසින් ඉදිරිපත් කළ එක් තර්කයක් නම් සිංහල ආණ්ඩුව මුළු ද්‍රවිඩ ජනතාවට ම විරුද්ධ ව්‍යාපාරයක් ගෙන යන බව ය. එය ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද එක් සාධකයක් වූයේ රජයේ ලේඛනවල දෙමළ යන්න වැරදි ලෙස ද්‍රවිඩ යනුවෙන් භාවිත කිරීමය. (ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ යන තැන්හි රජය යොදන ද්‍රවිඩ යන්න ද වැරදිය) මීට අනුව මිලියන 170 ක් වූ ද්‍රවිඩයන්ගේ සංස්කෘතිය සිංහල ආණ්ඩුව විසින් විනාශ කරන බව හුවා දක්වන ලදී. මෙය ඇත්ත වශයෙන් ම වැරදීමක් අයුතු ලෙස ප්‍රයොජනයට ගැනීමකි. එවැනි ම තවත් අඩුපාඩුවක් ද දෙමළ ජනතාව හිතාමතා ම අමතක කිරීමට ගත් උත්සාහයක් වශයෙන් මතු කොට පෙන්වා දෙනු ලැබිණ. මෙය නම් 1981 දි දිනමිණ පුවත් පතේ පළ වූ අතිරේකයකි. එම අතිරේකය පළ කරන ලද්දේ සර්වජන ඡන්ද බලය ලැබීමෙන් අවුරුදු 50 පිරිම නිමිත්තෙනි. මෙහි ඇස්. ඒ. වික්‍රමසිංහ හා එච්. ඩබ්ලිව්. අමරසූරිය 1931 දී පළමුවන රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්ව අද ද ජීවත්වන එකම දෙදෙනා බව සඳහන් විය. කරුණු නොදැනීමෙන්

හෝ අමතක වීමෙන් ඇස්.පී. වෛද්‍යලිංගම්ගේ නම එහි සඳහන් නොවීය. ඊළාම්වාදීහු මෙය ලෝකයට හුවා දැක්වූයේ වෛද්‍යලිංගම් සුළු ජාතිකයෙකු බැවින් හිතා මතා ඔහුගේ නම සඳහන් නොකළ බව ය.[22]

1981 දී වර්ල්ඩ් ටැමිල් රිසර්ච් කොන්ෆරන්ස් නමින් සාකච්ඡා සභාවක් දෙමළ සම්බන්ධීකරණ කමිටුව විසින් සමහර ඊරෝස් සාමාජිකයන්ගේ ද සහභාගිත්වයෙන් තමිල්නාඩුවේ දී පැවැත්විණ. එහි දී 1982 ජනවාරි මස 14 වන දින ඒකපාක්ෂික වශයෙන් දෙමළ ස්වාධීනත්වය ප්‍රකාශ කිරීමේ උත්සාහයක යෙදීමට තරම් ඊළාම් ව්‍යාපාරය එඩිතර වීය. එයින් අදහස් කරනු ලැබුවේ රොඩේසියාව, කාම්බෝජය, හා සිංගප්පූරුව යන රටවල ඇතැම් කාලවල තිබුණාක් මෙන් සැහවුණ රාජ්‍යයක් (ගවර්න්මන්ට් ඉන් එකසයිල්) තමන්ගේ නිජබිම යැයි ඔවුන් විසින් කියාගනු ලබන ප්‍රදේශයෙහි පිහිටුවා ගැනීම ය. ඒ සියලු රටවලට වඩා ලංකාවේ තත්ත්වය වෙනස් බැවින් ද එවකට දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ ඊට විරුද්ධ වූ හෙයින් ද බ්‍රිතාන්‍ය රජය එම අදහසට විරුද්ධ වූ නිසා ද ශ්‍රී ලංකා රජය ගත් ඇතැම් ක්‍රියා මාර්ග නිසා ද එම අදහස ව්‍යර්ථ විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඒ සඳහා ආධාර ඉල්ලුවත් එයින් පළක් නොවීය. ඉන්දියානු රජයෙන් ඊට අනුබලයක් නොලැබුණා පමණක් නොව එම ව්‍යාපාරයේ දී පෙරමුණ ගෙන ක්‍රියා කළ වෛකුණ්ඨවාසන් ඉන්දියාවෙන් පිටුවහල් කරනු ලැබිණ.

කෙසේ වුවත්, ජාත්‍යන්තර සංවිධාන මගින් ගෙන යන ලද ප්‍රචාරක කටයුතු අඩපණ නොවී ය. 1983 දී ආචාර්ය මික් මුවර් විසින් ශ්‍රී ලංකන් ප්‍රොපගැන්ඩ වෝ ඉන් යුරෝප් යන ලිපියෙන් ඉදිරිපත් කළ කරුණුත් ඒ වර්ෂයේදී ම එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටුව විසින් ඉදිරිපත් කොට තිබූ කරුණුත් මෙය සනාථ කරයි. එම කරුණු දෙමළ ප්‍රචාරක මාධ්‍යවේදීන් විසින් නොව ස්වාධීන යැයි කියනු ලබන පුද්ගලයන් විසින් හා ආයතන මගින් ඉදිරිපත් කිරීම මධ්‍යස්ථ කොටස්වල සිත් ඇද ගත්තාට සැකයක් නැත. අනුකමිටු වාර්තාවේ කරුණුවලට ජිනීවාවේ ශ්‍රී ලංකා තානාපති විසින් පිළිතුරු සපයනු ලැබිණ.[23] ඔහු මෙහිදී පෙන්වා දුන් තව කරුණක් නම්, ලෝක පල්ලි සම්මේලනය (වර්ල්ඩ් කෞන්සිල් ඔෆ් චර්චස්) විසින් ගෙන යනු ලබන සිංහල විරෝධී ව්‍යාපාරයයි.[24] මේ පදනම යටතේ විදේශීය ආධාර ඇතිව සන්නද්ධ අරගලයක් සඳහා දෙමළ තරුණයෝ සූදානම් වූහ. එහි ක්ෂණික ප්‍රතිඵලය වූයේ 1983 දී ආරක්ෂක හමුදාවේ දහතුන් දෙනෙකු ඝාතනය කිරීමයි.

(4) 1984-1991

ඉහත සඳහන් ඝාතනය හේතු කොට ගෙන 1983 ජූලි මස හටගත් දෙමළ විරෝධී ක්‍රියා නිසා ලංකාවේ දෙමළ ත්‍රස්තවාදීන්ට තනියම නැඟී සිටීමට නොහැකි බවත් දෙපිරිස අතර අතරමැදියන් සේ ක්‍රියා කිරීමෙන් පමණක් දෙමළ ජනතාවට ජයග්‍රහණයක් අත්කර දිය නොහැකි බවත්

අනුක්‍රමයෙන් දකුණු ඉන්දියාවට පැමිණෙන දෙමළ සරණාගතයන්ගේ ප්‍රමාණය වැඩිවන බවත් එයින් තමන්ට දැනට කෙලින් ම බලපාන ප්‍රශ්නය උග්‍ර වන බවත් දෙරටට හා කලාපයට බල පෑ හැකි වෙනත් කරුණුත් සලකා බලා එතෙක් අනුගමනය කළ මැදිහත් වීමේ ප්‍රතිපත්තිය වෙනස් කරමින් ඉන්දියාව ලංකාවට 'අණදෙන්නෙකුගේ' තත්ත්වයට පත් වූවා ය. 1983 දී ජී. පරතශාස්ත්‍රි ලංකාවේ ආරාධනයක් නැතිව ම ඉන්දිරා ගාන්ධි මැතිණිය විසින් එවන ලද්දේ එහෙයිනි, සම්මත ගුවන් නීති හා දෙශසීමා නීති උල්ලංඝනය කරමින් ඉන්දියාව අහසින් ඊනියා ආහාර පොදි යාපනයට හෙළන ලද්දේ ආහාර හිගයක් තිබූ නිසා නොව තම අණසකට ලංකාව යටත් විය යුතුය යන්න සංකේතවත් කිරීම උදෙසා ය. තදනන්තරව දිල්ලියේ දී න්‍යායපත්‍රය සකස්කොට කොළඹ දී සර්වපාක්ෂික සම්මේලනයක් පැවැත්විණ. තිම්පු සාකච්ඡා ජී. බන්දාරිගේ උපදෙස් මත පැවැත්විය යුතු විය. රජීව්-ජේ. ආර් ගිවිසුම බලෙන් අත්සන් කරවනු ලැබිණ. ලංකාවේ නිල නොලත් ආණ්ඩුකාරයා බවට ජේ. ඇන් දික්ෂිත් පත්විය. 1984-1991 දක්වා වූ කාලය තුළ දක්නට ලැබුණ මූලික ලක්ෂණය එයයි.

ජුලි ඝාතනය සම්බන්ධයෙන් ඇති වූ සිංහල ප්‍රතික්‍රියාවලට විරෝධය දැක්වීමේ ඉතා ප්‍රබල ව්‍යාපාරයක් මදුරාසියේ පිහිටා තිබූ දෙමළ තොරතුරු මධ්‍යස්ථානය විසින් ඉන්දීය රජයේ සහයෝගය ඇතිව දියත් කරනු ලැබිණ. ඇත්ත වශයෙන් ම, ජුලි කලබල ඊලාම්වාදීන්ට වෙස්වලාගෙන ආ ආශිර්වාදයක් විය. යාපනයේ පටන්ගත් සැටඩේ රිවීව් එම ව්‍යාපාරයට නව පණක් දුන් අතර එය ආරම්භයේ දී සෑහෙන ලෙස අලෙවි වූයේ ය. මෙම ප්‍රකාශනයට දායක වූ සිංහල හා දෙමළ මාක්ස්වාදී ව්‍යාපාර ද විය. පැහැදිලි ලෙස ම ජුලි කලබලවලින් වාසි ගත් අනෙක් කොටස වූයේ මාක්ස්වාදීන් හා විරුද්ධ පක්ෂයයි. ඔවුන් විසින් ජුලි සිද්ධීන්ට වෙනත් අර්ථකථන ඉදිරිපත් කිරීමට ගත් උත්සාහය නිසා සිංහලයින් අතර භේද උප්පන්න විය. එක්සත් ජාතික පක්ෂ රජය දරුණු අභියෝගයකට මුහුණපා සිටින බව දේශපාලන ප්‍රයෝජන ගැනීම එකම අරමුණ කර ගනිමින් හුවා දක්වා ඔවුන් හා ඔවුනට හිතවත් ජනමාධ්‍යවේදීහු ලොව වටා ප්‍රචාරයක් ගෙන ගියහ. එපමණක් නොව, එල්ටීටීඊ සාමාජිකයන් ත්‍රස්තවාදීන් වශයෙන් නොව නිදහස සඳහා සටන් කරන්නන් වශයෙන් මාක්ස්වාදීන් විසින් පමණක් නොව කතෝලික පියතුමන්ලා විසින් ද හඳුන්වනු ලැබිණ. උදාහරණයක් වශයෙන්, තිස්ස බාලසූරිය පියතුමා විසින් *1983 ඛේදවාචකය* නමින් වූ තම පොතේ ඔවුන් ගැන සඳහන් කොට ඇති කරුණු ගත හැකිය. යාපනය-මදුරාසිය-යුරෝපය හා අවශේෂ රටවල් හා සම්බන්ධ වූ එල්ටීටීඊ ප්‍රචාරක ජාලය සත්‍ය වශයෙන් ම අමුතු උද්දාමයකින් 1984-87 දක්වා කාලය තුළ ක්‍රියාත්මක වූයේ 1983 දී ඉහත කී කොටස්වලින් පිඹින ලද

ජීවවායුව නිසායැයි කීම අතිශයෝක්තියක් නොවේ. මේ හේතු කොටගෙන නෝර්වේ, නෙදර්ලන්තය, එංගලන්තය, ස්වීඩනය, කැනඩාව, ඇමරිකාව හා ඕස්ට්‍රේලියාව යන රටවල ද මෙම අදහස ප්‍රචලිත විය.

1984 අප්‍රියෙල් මස 14 වන දින අවුරුදු උත්සවය සැමරීම සඳහා ඕස්ට්‍රේලියාවේ ස්ට්‍රැට්ෆීල්ඩ් උසස් බාලිකා විද්‍යාලයෙහි පැවැත්වූ උත්සවයක දී එල්ටීටීඊ විසින් පොත් පිංචක් නිකුත් කොට තිබිණ. එහි පිට කවරය සකසා තිබුණේ ඊළාම් මාතාවගෙනි. පැන්ඇම් ගුවන් සමාගමේ සඟරාවෙහි ද මෙවැනි සිතියමක් ඊළාම් ඇසොෂියේෂන් ඔෆ් ඇමරිකා (සමර්විල්) යූ ඇස් ඒ සංවිධානය විසින් පළකර තිබුණි. (සිතියම් 2-3) මේවායේ අරමුණ වූයේ ඊනියා නිදහස සඳහා සටන් කරන්නන්ට ආධාර දීම ය.

ජුලි සිද්ධීන් සිද්ධවන විට තමිල්නාඩු දෙමළ හමුදා ලංකාවට පහර දෙන්නට ඔන්න මෙන්න කියා තිබිය දී ඉන්දිරා ගාන්ධි විසින් ජී. පරතශාස්ත්‍රි (මොහු දෙමළ ය) විශෙෂ දූතයෙකු වශයෙන් ලංකා ජනාධිපති වෙත එවන ලදී. ලංකා ජනාධිපති ඔහු පිළිගත්තේ ය. මේ අවස්ථාවේ දී නායකයින් දෙදෙනා ගත් මෙම ක්‍රියාකලාපය කාලෝචිත නොවේයැයි කිව නොහැකි ය. එසේ නොවුවා නම් ප්‍රශ්නය මුළුමනින් ම වෙනත් අතකට හැරෙන්නට ඉඩ තිබුණ බැවිනි. ඉන්දියාවේ අණපරිදි එල්ටීටීය හා රජය අතර යුද්ධය නැවැත්වීමේ ගිවිසුමක් ජුලි සිද්ධිවල ප්‍රතිඵල වශයෙන් ඇතිවුව ද එය ක්‍රියාත්මක නොවී ය. එයට හේතුව වූයේ ලංකා හමුදාවේ ක්‍රියාකලාපය බව දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ මගින් රජීව් ගාන්ධි වෙත 1985 දෙසැම්බර් මස යවන ලද ලිපියක සඳහන් වේ.[25] තවද, ශ්‍රී ලංකා හමුදාව ජනසංහාරයකට අර අඳින බවත් එයින් දෙමළ ජනතාව මුදා ගත හැක්කේ ඉන්දියාවට බවත් එහි සඳහන් විය. තවදුරටත් ඉදිරියට ගිය මෙම ලිපිය මීට පෙර ඉන්දියා රජය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතික්‍ෂෙප කරන ලද බව ද අවධාරණය කරනු ලැබිණ. ඊට උදාහරණයක් සපයමින් ඉන්දියාව විසින් සකස්කරන ලද න්‍යායපත්‍රය අනුව ජේ. ආර්. ජයවර්ධන සර්වපාක්‍ෂික සම්මේලනය හෝ ආරම්භක පත්‍රිකාව අනුව තිම්පු සාකච්ඡා හෝ නොපවත්වන ලද බව එහි සඳහන් විය. මේ කරුණු අනුව තමනට ශ්‍රී ලංකා රජය කෙරෙහි විශ්වාසයක් තැබිය නොහැකි බවත් විශ්වාසය ඇත්තේ ඉන්දීය රජය කෙරෙහි පමණක් බවත් කියා සිටියේ ය. මේ හුවා දැක්වීම්වල අරමුණ වූයේ ඉන්දියාව හා ලංකාව අතර මිත්‍රත්වය පලුදු කිරීමත් තමන්ගේ වැඩි කුලුපග භාවය ඇත්තේ ඉන්දියාවට බවත් පෙන්වීමත් ය. මෙය මිත්‍රභේදය නම් වූ පැරණි සුප්‍රකට දේශපාලන න්‍යාය අනුගමනය කිරිමකි.

ඉන්දියාවේ ප්‍රතිපත්තිය වන්නේ උතුරු හා නැගෙනහිර පළාත් දෙක සඳහා ස්වාධීන රාජ්‍යයක් ලබා නොදීම බැව් තේරුම් ගත් ඔවුන් විසින් තම අරමුණ වෙනත් අයුරකින් ඉටුකර ගැනීම පිණිස 1985 දී ඉහත සඳහන් ලිපියත් සමග යෝජනා මාලාවක් ඉන්දීය රජය වෙත ඉදිරිපත් කරනු

ලැබිණ. වචන කීපයක හා ඉදිරිපත් කිරීමේ පිළිවෙල හැරුණවිට අද ඉදිරිපත් කොට ඇති දේශපාලන යෝජනා සැබවින් ම එම යෝජනාම ය. ඉන්දියාව විසින් ද එවකට තිබූ ලංකා රජය විසින් ද හේතු සාධක මත එම යොජනා ප්‍රතික්ෂෙප කරන ලදී. එම ඒක පාක්ෂික යෝජනා වර්තමාන රජය විසින් ක්‍රියාත්මක කිරීමට යෑම වර්තමාන යොජනා ලංකාවේ බහුතරය විසින් ප්‍රතික්ෂෙප කිරීමට ප්‍රධාන හේතු වේ.

කෙසේවුවද, විසඳුමක් සෙවීම සඳහා ඉන්දියාව උත්සුක වූවා ය. ඉන්දියාවේ මූලිකත්වය යටතේ මේ කාලය තුළ දී දෙරට අතර බහුල වශයෙන් හුවමාරු වූ දූත පිරිස්වලින් මෙය සනාථ වෙයි. මේවා ඇත්ත වශයෙන් ම, දිල්ලිය-මද්‍රාසිය-කොළඹ යන ත්‍රිකෝණ සාකච්ඡා විය. ඉන්දියානු නියෝජිතයා වූ පරතශාස්ත්‍රී දිල්ලියේ සිට ලංකාවට ආවේත් ආපසු දිල්ලියට ගියේත් මද්‍රාසිය හරහා ය. නට්වර් සිං හා පී. සිදම්බරම් ද මේ සාකච්ඡා සඳහා ලංකාවට ආවේ මද්‍රාසියේ දී ත්‍රස්තවාදී කණ්ඩායම් හා දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ නියෝජිතයන් හමුවීමෙන් පසුව ය. දෙමළ නායකයන් සාකච්ඡාවට සහභාගි වූයේ ඉන්දීය නියෝජිතයන් මගින් වීම නිසා මද්‍රාසිය හරහා යාම හා ඒම අවශ්‍යව තිබිණැයි තර්ක කිරීම ඇත්තට ළං නොවන්නකි. අවශ්‍ය පමණට වඩා නායකත්වයක් මද්‍රාසියෙන් දෙන ලද බැවින් හා ලංකාවේ දී දෙමළ නියෝජිතයන් හමුවීමට බාධාවක් නොතිබූ බැවිනි.

ජනාධිපතිතුමා 1983 නොවැම්බර් මස දිල්ලියට ගියේ ය. ආචාර්ය එච්. ඩබ්ලිව්. ජයවර්ධන හා නියෝජිතයෝ එක් අවස්ථාවක ඉන්දියාවේ නීතිපති හමුවී ලංකාවේ සුදුසු ඒකකවලට ව්‍යවස්ථාදායක හා විධායක බලතල දීම පිළිබඳව සාකච්ඡා කළහ. එහි දී දෙමළ නියෝජිතයන් අවධාරණයෙන් කියා සිටි දෙයක් නම් උතුරු හා නැගෙනහිර පළාත් දෙක ඒකාබද්ධ කරන ලෙස ය. එහෙත් 1986 දී සිං හා සිදම්බරම් කියා සිටියේ නැගෙනහිර ප්‍රදේශය කොටස් තුනකට කඩා එම පළාත නැවත බෙදීමට ශ්‍රී ලංකා රජය කර ඇති යෝජනාවට වඩා යමක් බලාපොරොත්තු නොවිය යුතු බවයි. තවද, 1944 දී බ්‍රිතාන්‍යයන් විසින් යෝජනා කරන ලද දෙමළ නැගෙනහිර, මුස්ලිම් නැගෙනහිර හා දෙමළ උතුර යනුවෙන් උතුර හා නැගෙනහිර බෙදීමට කර තිබූ යෝජනාව ද විකල්පයක් වශයෙන් ඔවුහු ඉදිරිපත් කළහ. මෙම යෝජනාව මගින් නැගෙනහිර පළාතේ ඇති සිංහල ප්‍රදේශ එම ප්‍රදේශයෙන් වෙන්කොට යාබද පළාත්වලට එකතු කිරීමට ද යෝජනා විය.[26] 1987 දී රජීව් - ජේ. ආර් ගිවිසුම ද එහි කොන්දේසි මත සම්මත කළ 13 වන ව්‍යවස්ථා සංශොධනය ද ඉන්දියාවේ අණසක මෙකල ලංකාවේ ක්‍රියාවට නැංවූ හැටි පැහැදිලි කරයි. ඉන්දියානු හමුදාවක් සාමසාධක හමුදා නාමයෙන් උතුරු හා නැගෙනහිර පෙදෙස් හි නැවත් වූවා පමණක් නොව පොදු උපදේශක ක්‍රියා පිළිවෙත යටතේ විදේශ සම්බන්ධතා පිළිබඳව පහත සඳහන් තීරණ ද දෙරට විසින් ගනු ලැබිණ.

1 විදේශීය යුද්ධ හා රහස් ඔත්තුසේවා නිලධාරීන් ලංකාවේ සිටීම ඉන්දු-ලංකා සම්බන්ධතාවලට හානි නොවන පරිදි විය යුතු ය.

2 ඉන්දියාවේ කටයුතුවලට බාධාවන ආකාරයෙන් ත්‍රිකුණාමලය හා අවශෙෂ වරායන් යුද්ධමය කටයුතු සඳහා පාවිච්චි කිරීමට වෙනත් රටවලට නොදිය යුතු ය.

3 ඉන්දියාවේ සහ ලංකාවේ පොදු ව්‍යාපාරයක් වශයෙන් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංවර්ධනය කළ යුතු ය.

4 ලංකාව තුළ පිහිටා ඇති විදේශීය ගුවන්විදුලි සංවිධාන යුද්ධමය හෝ රහස් ඔත්තු සේවාවලට අදාළ වූ කිසිම කාර්යයක් සඳහා පාවිච්චි නොකළ යුතු ය.

මෙම ගිවිසුමට අනුව දෙමළ කණ්ඩායම් විසින් තමන් සතු අවි ආයුධ ශ්‍රී ලංකා රජයට භාරදිය යුතු විය. එය නොපිළිපැදීම නිසා ඉන්දීය රජය හා ඔවුන් අතර විශ්වාසය දෙදරන්නට වූ අතර ඉන්දීය හමුදාවලට විරුද්ධව සටන් කරන්නට ද පටන්ගත් හෙයින් දෙපිරිස අතර වූ භේදය උග්‍රවන්නට විය. අනිත් අතට, ශ්‍රී ලංකාවේ නවජනාධිපති ප්‍රේමදාස මහතා ඉන්දීය හමුදාවලට විරුද්ධව සටන් කිරීම සඳහා එල්ටීටීයට යුද්ධමය ආධාර සැපයීම ද විපක්ෂයේ බලවත් උද්ඝෝෂණ ව්‍යාපාර ද, විදේශීය හමුදාවක් මෙරටේ රැඳී සිටීම රටේ ස්වාධිපත්‍යයට හානියක් බව එතුමාගේ අවංක පිළිගැනීම ද වූ නිසා එම හමුදා ආපසු යැවීම ද කරණකොට ගෙන දෙරට අතර මිත්‍රත්වයට හානියක් වූ බව සත්‍යයකි. එසේ ද වුවත්, ඉන්දියාව මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අනුගමනය කළ දෙබිඩි පිළිවෙත නිසා ලංකා ජනතාව විසින් ඉන්දියාව මෙසේ ප්‍රතික්ෂෙප කිරීම දේශපාලනමය වශයෙන් විය යුත්තකි.

1984 අගෝස්තු 2 දා මද්‍රාසියේ මීනම්බක්කම් ගුවන් තොටුපල දෙමළ ත්‍රස්තවාදීන්ගේ බෝම්බයකින් විනාශවී තිස් දෙනෙක් මරණයට පත් වූහ. ඊළාමයෙහි ස්වෛරී රාජ්‍යයක් පිහිටුවා ගත හැකි වේ නම් එක් ගුවන් තොටුපලකට වඩා පරිත්‍යාග කිරීමට දෙමළ ජනතාව සූදානම් විය යුතු යැයි කාම්රාජ් කොංග්‍රසයේ නෙදුමාරන් ප්‍රකාශ කළත්, උසාවිය මගින් සිද්ධියට සම්බන්ධ සියලු සැකකරුවන් නිදහස් කළත් ඉන්දීය බහුතරය කලකිරුණ අතර ජාත්‍යන්තර වශයෙන් එල්ටීටීය මේ නිසා අපකීර්තියට පත් විය. සික් අන්තවාදීන් විසින් 1984 ඔක්තෝබර් මස 31 දා ඉන්දිරා ගාන්ධි මැතිණිය ඝාතනය කිරීම ත්‍රස්තවාදයේ භයානකකම ලොවට පෙන්වන තව කරුණක් විය. අනිත් අතට, 1987 සිට එල්ටීටීය අනුගමනය කළ ඉන්දීය විරෝධී ප්‍රතිපත්තිය නිසා ඔවුන්ට ජාත්‍යන්තර වශයෙන් තිබූ පිළිගැනීම දෙදරා ගියේ ය. එවකට ලංකා රාජ්‍ය අමාත්‍යාංශය මගින් *ටැමිල් ටෙරරිසිට්ස් - අ රෙකෝඩ් ඔෆ් මර්ඩර් ඇන්ඩ් රොබරි* හා ද *ෆැක්ට්ස්* ආදී ප්‍රකාශන කිපයක් මෙකල පළ කිරීම වැදගත් ය. තවද සෙන්ටර් ෆෝ එත්නික් ඇමිටි

නම් වූ සංවිධානය මගින් පළකරන ලද ද එත්නික් ප්‍රොබ්ලම් ඉන් ශ්‍රී ලංකා කාණ්ඩ මගින් ද එල්ටීටීය ප්‍රතිප්‍රචාරක කාර්යයන් හා ඔවුනගේ ඉල්ලීම්වල සාවද්‍ය බව පෙන්වීම සඳහා අලුත් තර්ක සමහරක් ඉදිරිපත් කරනු ලැබිණ. ලංකා රජය විසින් මෙවැනි ප්‍රචාරක කටයුතු මගින් එල්ටීටීය දමරික කණ්ඩායමක් වශයෙන් උලුප්පා පෙන්වීම පහසුවෙන් යටපත් කළ නොහැකි විය. එල්ටීටීය 1987 ගිවිසුමට අනුකූල නොවීමත් සාමසාධක හමුදාව සමග ඔවුන් යුද්ධ කිරීමත් ඉන්දියාව ඔවුන් හා උරණ කරවන සිද්ධි විය. මෙම ගිවිසුම ක්‍රියාවට නැංවීමේ භාරදූර කාර්යය භාරව සිටි ජේ. ඇන්. දික්ෂිත් පකිස්තානයේ දී ප්‍රභාකරන් ගැන මෙසේ කීවේය: "අවුරුදු තුනක් තරම් වූ කලක් ඔහු ඇසුරු කළ ඉන්දියානුවන්ගෙන් කෙනෙකු වූ මට ඔහු පිළිබඳව කළ හැකි අවසන් නිගමනය වනුයේ ඔහු අතිශය ආත්මාර්ථකාමී ආඥාදායෙකු බව ය". එහෙයින්, ඉන්දියාවේ ජාත්‍යන්තර ප්‍රචාරක ජාලය හා රෝ. සංවිධානය මගින් ජාත්‍යන්තර එල්ටීටීඊ විරෝධී ප්‍රචාරයක් ගෙන යනු ලැබිණ. එය ලංකාවට බෙහෙවින් වාසිදායක විය. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ ලංකාවේ විදේශ ප්‍රචාරක කටයුතු ඇත්ත වශයෙන් ම ඉතාමත් ප්‍රාථමික තත්ත්වයක පවතින නිසා ය.

තවද, රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා වූ රන්ජන් විජේරත්න, ලලිත් ඇතුලත්මුදලි හා ජනාධිපති ආර්. ප්‍රේමදාස ඝාතනය වැනි ඒවා නිසා එල්ටීටීය ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට පත්විය. මේ තත්ත්වය යටතේ එල්ටීටීයට හිතවත් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට එල්ටීටීය ආරක්ෂාකිරීම සඳහා දැඩි අරගලයක යෙදෙන්නට සිදු විය. මේ සංවිධාන අතර ප්‍රියෝ (පීස් රිසර්ච් ඉන් ඔස්ලෝ), ඉන්ටර්නැෂනල් ඇලර්ට් (හේග්), හියුමන් රයිට්ස් කෞන්සිල් (ඔස්ට්‍රේලියා), ටැමිල් ඇසෝෂියේෂන් (ඔස්ට්‍රේලියා) ඉන්ටර්නැෂනල් ෆෙඩ්රේෂන් ඔෆ් ටැමිල් (එංගලන්තය මෙය සංවිධාන අටක එකතුවකි.) ද ෆෙඩරේෂන් ඔෆ් ඇසොෂියෙෂන් ඔෆ් කැනේඩියන් ටැමිල්ස්, වර්ල්ඩ් ෆෙඩ්රේෂන් ඔෆ් ටැමිල්ස්, වර්ල්ඩ් ටැමිල් මූව්මන්ට් හා වර්ල්ඩ් කෞන්සිල් ඔෆ් චර්චර්ස් මුලික තැනක් ගනී. ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානයෙහි අධ්‍යක්ෂවරයා කුමාර් රූපසිංහ ය. ඊට කලින් ඔහු ප්‍රියෝ සංවිධානයේ ද අධ්‍යක්ෂවරයා විය. ඔහු ලංකාවේ සිටිය දී ජනවේගය නම් වූ උග්‍ර වාමාංශික කල්ලියක් මෙහෙය විය. ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානයෙහි මාර්ටින් ඇනල්ස් ලංකාවට නිතර පැමිණේ. ඔහු ඊට පෙර ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි මහලේකම් වූයේ ය. ඉන්ඩියා වීක්ලි සඟරාව වාර්තා කළ අන්දමට (20.2.1987) ඔහු 1987 පෙබරවාරි මාසයේ දී ශාන්ත ඕගස්තන්ගේ පල්ලියේ පැවැත්වූ රැස්වීමකට සහභාගි වූ අතර එහි දී දෙමළ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන ලෙස බ්‍රිතාන්‍ය රජයට බලකර සිටියේ ය. තවද, බ්‍රිතාන්‍යයේ සිටින දෙමළ සිරකරුවන් නිදහස් කරන ලෙස ද ඉල්ලා සිටියේ ය.

මේ සංවිධානවල තව අරමුණක් මේ කරුණුවලින් හෙළි වේ. එනම් නීත්‍යානුකූල නොවන සංක්‍රමණිකයන් ආරක්ෂා කිරීම ය. ලංකා රජය දෙමළ ජනතාව පෙළන හෙයින් ඔවුන් රැකවරණ පතා විදේශවලට යන බවත් ඒ ගැන සානුකම්පිකව ඒ ඒ රජය විසින් බැලිය යුතු බවත් පුන පුනා මේ සංවිධානවලින් කියන ලදී. ඇතැම් විටෙක ත්‍රස්තවාදී ක්‍රියා වැඩි වශයෙන් කරගෙන ගියේත් ජාත්‍යන්තර ප්‍රචාරක ව්‍යාපාර වැඩි උනන්දුවකින් කරගෙන ගියේත් එල්ටීටීඊ ආර්ථිකය ද ශක්තිමත් කිරීම සඳහා ය. තවද, මේ සරණාගත ප්‍රශ්නය දෙමළ ත්‍රස්තවාදයට මුදල් සොයා ගැනීමේ උපාය මාර්ගවලින් එකක් ද විය. ලෝක දෙමළ සංවිධානය විසින් 1988 අප්‍රියෙල් මාසයේ දී ලන්ඩන් නගරයේ දී පැවැත් වූ ආරම්භක රැස්වීමේ දී කොට්ටි සංවිධානය ඇතුළු සියලු දෙමළ සංවිධාන විසින් 1985 දී තිම්පු සාකච්ඡා සඳහා ඉදිරිපත් කළ මූලික දෙමළ ප්‍රතිපත්ති තහවුරු කරන ලදී. මෙරට දෙමළ ජනයාගේ එකම නියෝජිත සංවිධානය හැටියට එල්ටීටීය පිළිගන්නා ලදී. ලෝක දෙමළ සංවිධානයේ ආරම්භක සභාපති වූයේ පේරාදෙණි විශ්ව විද්‍යාලයේ හිටපු ගණිත මහාචාර්ය සී. ජේ. එලියසර් ය. උපදේශක වූයේ වෙල්වනායගම්ගේ බෑනා වූ ඒ. ජෙයරත්නම් විල්සන් ය.(28)

1988 දී වයිඩර් (වර්ල්ඩ් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිවොලප්මන්ට් ඊකොනොමික් රිසර්ච්) ආයතනයේ අධ්‍යක්ෂක වූයේ ආචාර්ය ලාල් ජයවර්ධන ය. ඔහු මෙරට සුප්‍රකට වාමාංශිකයෙකු වූ මහචාර්ය කාලෝ ෆොන්සේකාට ලංකාවේ සාමය ගොඩ නැගීම සඳහා පර්යේෂණ කරන ලෙස ආරාධනා කෙළේ ය. එහි ප්‍රතිපලයක් වශයෙන් *ටුවර්ඩ්ස් අ පීස්ෆුල් ශ්‍රී ලංකා* නම් ග්‍රන්ථය පළ විය. මේ පර්යෙෂණයේ දී වැඩි වශයෙන් කර ඇත්තේ ලංකාවේ එතෙක් පිළිගෙන තිබූ විශ්වාසවලට පහර ගසා සිංහල බෞද්ධයන් හැල්ලුවට ලක්කොට ඔවුන් එම මතිමතාන්තරවල එල්බ සිටින තුරු සාමය උදා කළ නොහැකිය යන පනිවිඩය දීම ය. ඔවුන් සඳහන් කරන මිථ්‍යා අතර මහාවංශය විශ්වාස කිරීම, සිංහලයින් සහ ආර්යයන් අතර සම්බන්ධය හා බුදුසමය රාජ්‍යාගම වීම ආදිය වෙයි.(29)

(5) 1992 සිට අද දක්වා

1991 මැයි මස 21 වන දින රජීව් ගාන්ධි ඝාතනය කිරීමේ චෝදනාව මත ඉන්දියාව විසින් එල්ටීටීඊය අධිකරණය හමුවට ගෙන්වනු ලැබී ය. එසේම, එල්ටීටීඊය ඉන්දියාවෙහි තහනම් කරනු ලැබිණ. එල්ටීටීඊ විරෝධී ලෝකප්‍රචාර අමුතු මගක් ගත්තේ ය. එල්ටීටීඊ ක්‍රියාකාරකම් සොයා බැලීම සඳහා සෑම වැදගත් රටකම පිහිටි ඉන්දියානු තානාපති කාර්යාලවල ඒකක පිහිටුවනු ලැබිණ. රෝ සංවිධානය මගින් ඒ පිළිබඳව සියුම් ඔත්තු සේවාවක් පවත්වා ගෙන යෑමට පටන් ගත්තේ ය. ඇතැම් ලංකා තානාපති කාර්යාල ඉන්දියානු තානාපති කාර්යාලවලින් සමහර තොරතුරු ලබා ගත්තේ ය. මෙවැනි කාර්යයන් සඳහා කිසිදු පහසුකමක් ලංකා තානාපති කාර්යාල සතුව නොතිබීම නිසා ඒවාට කළ හැකි වෙනත් දෙයක් නොවීය. රජීව් ගාන්ධිගේ මරණය සම්බන්ධයෙන් ප්‍රභාකරන් සැකකරුවෙකු වන බැවින්

ඔහු අල්ලා ඉන්දියාවට එවන ලෙස ඉන්දියා රජය ලංකා රජයෙන් ඉල්ලීම් කෙළේය. කෙසේවුවත් තම මැතිවරණ ව්‍යාපාරයේදී කුමාරතුංග මැතිණිය කියා සිටියේ තමන් බලයට පත්වුවහොත් ප්‍රභාකරන් අල්ලා ඉන්දියාවට භාර නොදෙන බවයි. එය ඡන්දය සම්බන්ධයෙන් වූ උපායක් විය හැකි ය. එම ව්‍යාපාරයේ දී එවකට ජනාධිපතිවරයා වූ ඩී. බී. විජේතුංග මැතිතුමා කියා සිටියේ එල්ටීටීය ත්‍රස්තවාදී ව්‍යාපාරයක් බවත් දිවයිනේ ඇත්තේ ජනවාර්ගික ප්‍රශ්නයක් නොව ත්‍රස්තවාදී ප්‍රශ්නයක් පමණක් බවත් ය. එවැනි ප්‍රකාශයක් කළ පළමුවන ජනනායකයා ඔහු ය. ඇමරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුව ඒ අනුව යමින් දේ 1995 දී එල්ටීටීය ත්‍රස්තවාදී ව්‍යාපාරයක් බව ප්‍රකාශ කෙළේ ය. මේ නිසා ඉතා සංවිධානාත්මකව ක්‍රියාත්මක වූ යාපනය-ඉන්දියාව-ජාත්‍යන්තරය නම් වූ ඊළාම් ප්‍රචාරක ත්‍රිකෝණයේ අත්තිවාරම දෙදරා ගියේ ය.

ඉන්දියාවේ එල්ටීටීඊ විරෝධී කටයුතු රහස් ඔත්තු සේවා මගින් හා ආරක්ෂක සේවා මගින් ද ගෙන යනු ලැබිණ. සී.බී.අයි. (සෙන්ට්‍රල් බ්‍යුරෝ ඔෆ් ඉන්වෙස්ටිගේෂන්) බොම්බායේ ලෝකන්ධවල නිවසක පවත්වාගෙන ගිය ලෝපුරා සම්බන්ධතා තිබූ ආයුධ මිළදී ගැනීමේ එල්ටීටීඊ මධ්‍යස්ථානය 1991 ජුනි 1 දා වටලනු ලැබුවේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. එම නිවස අයත්ව තිබුණේ ධර්මලිංගම් එස්. කුමාර නමැත්තෙකුට ය. බෙංගාල ජාතික නැක්සලයිට් කාන්තාවක් වූ ප්‍රතිමාදස් ඔහුට මේ කාර්යවල දී සහාය වුවාය.[30] එල්ටීටීඊයට උදවු දීම පිළිබඳ චෝදනාවට පත්තලිමක්කල් පක්ෂයේ ආරම්භක නායකයා වූ එස්. රාමදාස් එහි හිටපු ඇමතිවරයෙකු වූ එස්. රාමචන්ද්‍රන් දෙමළ ජාතික පක්ෂයේ පී. නෙදුමාරන් ඇතුළු අට දෙනෙකු ඇතුලු විශාල පිරිසක් ආරක්ෂක අංශ මගින් ඒ වකවානුවේ දී ම අත් අඩංගුවට ගන්නා ලදී. පත්තලි මක්කල් පක්ෂය විසින් ටැමිල් රයිට් ටු ලිව් යන නමින් සම්මේලනයක් පැවැත්වූ අතර එහි දී ප්‍රභාකරන්ට සහ ඔහුගේ ව්‍යාපාරයට උදවු දෙන බව ප්‍රසිද්ධියේ පැවසිණ. මෙම ක්‍රියාව නොයෙක් සංවිධාන මගින් හෙලා දකින ලද අතර එහිදී ඒ.අයි.ඩී.ඇම්.කේ. පක්ෂය ප්‍රමුඛ තැනක් ගන්නා ලදී. එල්ටීටීය තහනම් කළ යුතුය යන ව්‍යාපාරයේ ප්‍රමුඛත්වය ගෙන සිටියේ මෙම පක්ෂයයි. ජනමාධ්‍යවලින් ද මෙයට සැහෙන ප්‍රතිචාරයක් දැක් වූ අතර එල්ටීටීඊ තහනමට විරුද්ධවන්නන් සඳහා දැඩි ක්‍රියාමාර්ගයක් ගත යුතුයැයි හින්දු පුවත්පත තම 1992 සැප්තැම්බර් මස 19 වන දින කතුවැකියෙන් අවධාරණය කර සිටියේය. ඉන්දියාවේ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති චාවන් ප්‍රකාශ කෙළේ එල්ටීටීය ඉන්දියාවේ ස්වෛරීභාවයට හා භෞමික අඛණ්ඩතාවට පහරක් බව ය.[30] ඉන්දියානු ජනතාව රජීව් ඝාතනය හෙලා දැකීමේ ප්‍රතිඵල කෙතරම් ද යන්න එල්ටීටීය පෝෂණය කිරීම සඳහා අසීමිත සේවාවක් කළ මහඇමති කරුණානිධි නොබෝදා නැවත වරක් මහ ඇමති වීමෙන් පසුව වුව ද එල්ටීටීයට ප්‍රසිද්ධියේ උදවු දීමට මැලිකමක් දැක්වීමෙන් පෙනී යයි.

මෙයින් පසු කාලයේ දී එල්ටීටීඊ ව්‍යාපාරයට මෙසේ දරුණු ප්‍රහාරයක් එල්ල වූ බැවින් ඊළාම් සඳහා වූ ප්‍රචාරක කටයුතු සාම සාකච්ඡා වෙත වඩා නැඹුරු කරවන ලද බව පෙනේ. ඊළාමය දීම සඳහා වූ ව්‍යාපාර දෙපරිදි විය. එනම්, දෙමළ ජනතාවට ඓතිහාසික අසාධාරණයක් වී ඇතැයි කෙළින් ම ප්‍රකාශ කරමින් ඔවුන්ට ආධාර කිරීම හා සාමය උදාකිරීමේ මුවාවෙන් අවශ්‍ය ඉලක්කය කරා යාමට ඔවුන්ට පහසුකම් සැලසීමය. සමහරු "පීස්" යන වචනය ඇදාගනිමින් තම සංවිධාන හඳුන්වා ගත්තේත් පීස් රිසර්ච් කරන ලද්දේ මේ දෙවන අරමුණ පෙරදැරි කරගෙන ය. එල්ටීටීය ජනප්‍රියත්වයෙන් ගිලිහී යන විට බෙහෙවින් අනුගමනය කළේ දෙවන ක්‍රමයයි. 1992 පෙබරවාරි මස 15 වන දින ඉන්ටර් නැෂනල් ෆෙඩරේෂන් ඔෆ් ටැමිල්ස් නම් වූ සංවිධානය මගින් ලන්ඩන් විශ්ව විද්‍යාලයෙහි පෙරදිග හා අප්‍රිකානු අධ්‍යයන ආයතනයෙහි දී සම්මන්ත්‍රණයක් පැවැත්විණ. එහිදී පැවැත් වූ මූලික දේශනයට අමතරව 1 ද ටැමිල් නැෂනල් අයිඩෙන්ටිටි ඇන්ඩ් ද සර්ච් ෆෝ ඇසොෂියේටිව් ස්ට්‍රක්චර්, 2 සෙට්ල්මන්ට් ඔෆ් ද කොන්ෆ්ලික්ට් ත්‍රෑ ඇන් ඇකෝර්ඩ්, 3 ටැමිල් 'ඊළාම්' ස් රයිට්ස් ටු සෙසීඩ් ඇන්ඩ් ද 13ත් ඇමෙන්ඩ්මන්ට් හා කැපෑසිටි ඔෆ් ටැමිල් ඊළාම් ටු කොන්ක්ලූඩ් අ පීස් ට්‍රීටි වැනි මාතෘකා යටතේ ද පත්‍රිකා කියවනු ලැබිණ.

මෙම සම්මන්ත්‍රණයේ අභිප්‍රාය දෙකක් විය. එනම්, දෙමළ බෙදුම්වාදීන් විසින් ඊළාමයක් සඳහා එතෙක් ගෙන ගොස් තිබූ කටයුතු සමාලෝචනය කොට ඒවායේ නිරවද්‍යතාවය පෙන්වා දීමත් ඊළාමය දිනා ගැනීම සඳහා සාම සම්මුතියකට එළඹෙන්නේ කෙසේ ද යන්නත් ය. මෙම සංවිධානය මගින් මෙම වර්ෂයේ දීම පවත්වනු ලැබූ අනිත් සම්මන්ත්‍රණයේ දී ටැමිල්ස් ක්වෙස්ට් ෆෝ ස්ටේට්හුඩ් නම් පත්‍රිකාවේ අඩංගු කරුණු ගැඹුරින් සාකච්ඡා කෙරිණ. එහිදී අවධාරණය වූ කරුණක් නම් ස්වයංනිර්ණ අයිතිය දීම සඳහා ලෝකයේ නොයෙක් රටවල ව්‍යුහගත වෙනස්කම් කර ඇති නිසා ලංකාවේ ද එසේ කොට දෙමළ වර්ගයාට එම අයිතිය දියයුතු බවත් එසේ දීමේ දී ප්‍රභාකරන් නායකයා වශයෙන් පිළිගත යුතු බවත් ය. 1993 මාර්තු මස ටොරන්ටෝ නගරයෙහි පීස් කොන්ෆරන්ස් ඉන් ටොරන්ටෝ ෆෝ ද එත්නික් කොන්ෆ්ලික්ට් ඉන් ශ්‍රී ලංකා නම් සංවිධානය බිහි විය. මෙහි කටයුතු කරගෙන යාම සඳහා කැනඩා රජයෙන් මූල්‍යමය ආධාර ද ලැබිණ. 1994 මාර්තු මස 4 වන දින ඉන්ඩියා ඇබ්‍රෝඩ් වාර්තා කළ පරිදි ඩොලර් දෙලක්ෂ අසූහත්දාහක් කැනඩා රජය විසින් දෙමළුනට තම ව්‍යාපාරය කරගෙන යාම සඳහා දෙන ලදී. එමගින් පවත්වන ලද සාමාභිවර්ධන සම්මේලනයේ දී සම්මත වූ යෝජනාවක් වූයේ ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු සංස්කෘතික රටක් වශයෙන් පිළිගත යුතු බවත් ඒ අනුව පාඨශාලා නිර්දෙශ පත්‍ර වෙනස් කළ යුතු බවත් ය. සිංහල අනන්‍යතාව බිඳ දැමීම සඳහාත් දෙමළ අයිතිවාසිකම් ලබාදීම සඳහාත් කුමන ආකාරයේ සංවිධානාත්මක වැඩ පිළිවෙලක් ගෙන ගියාද යන්න මෙයින් හෙළි වේ.

500කට වැඩි හමුදාවක් උතුරට හා නැගෙනහිරට එවන ලෙස එම වර්ෂයේ දී ම දෙමළ ත්‍රස්තවාදීන් විසින් එක්සත් ජාතීන්ගේන් ඉල්ලා සිටින ලදී. එහි අරමුණ වුයේ යුද්ධය නැවැත්වීමේ ගිවිසුම පරීක්ෂා කිරීම ය. සීඩා ආයතනයෙන් මුදල් ලබා කැනේඩියානු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ද සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබිණ. මෙයට ගනනාත් ඔබේසේකර, එම්. එල්. එච්. හිස්බුල්ලා, පල්ලේකන්දේ රත්නසාර හිමි හා මර්ජ් ආයතනයේ ආරම්භකයා වූ බාලක්‍රිස්නන් එන්. ෂන්මුගරත්නම් ද සහභාගි වූහ. මෙහි දී සාකච්ඡා වූ කරුණු අතර දෙමළ මූලික ප්‍රතිපත්ති තහවුරු කිරීම, 1956 සිට ජනවාර්ගික අර්බුදයක් ලංකාවේ හට ගෙන තිබීම, නැගෙනහිර දේශසීමා වෙන් කිරීම, රජයේ සිංහල ජනපද උතුරු හා නැගෙනහිර ඇතිවීම වැලැක්වීම, 1984 සිටි සියළුම වතු දෙමළුනට පුරවැසි කම් දීම, රජය පනවා ඇති ආර්ථික සම්බාධ ඉවත් කිරීම, ශ්‍රී ලංකා පොලිසිය හා හමුදාව දෙමළුනට විරුද්ධව කටයුතු නොකිරීම ආදිය විය. 1993 වර්ෂයේ දී ම නෝර්වේ සම්මේලනයක දී පැවැත් වූ සාකච්ඡාවක් අනුව ජනවාර්ගික අර්බුදය විසඳීම සඳහා නෝර්වේජියානු රජයට මැදිහත් වන ලෙස ඉල්ලා සිටින ලදී. ඒ මැදිහත්වීම යටතේ ලංකාව කොටස් පහකට කඩා ඒවාට ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල දෙන ලෙස ඉල්ලා සිටියහ. එම කොටස් පහ නම්, බටහිර, මධ්‍යම පළාත, ඌව, දකුණ සහ උතුරු නැගෙනහිර ය. මෙහි දී ඇතැමෙකු විසින් ඉදිරිපත් කළ අදහසක් නම් රජය සහ කොටින් නැතිව කරනු ලබන සාකච්ඡාවලින් අර්ථයක් නැත යන්නයි. දෙමළ ජනතාවගේ නියම නියෝජිතයින් හැටියට ලෝකයට කොටින් හුවා දැක්වීම මෙහි අරමුණ විය.

එල්ටීටීඊ පක්ෂපාති සංවිධානවල ඊළඟ කාර්යය වූයේ යුද්ධ නැවැත්වීමේ ගිවිසුමකට එලඹෙන ලෙස ලංකාණ්ඩුවට බලපෑම් ඇති කිරීම ය. එය බොහෝ විට කරනු ලැබුවේ එල්ටීටීය දුර්වල වූ විට ය. එය නැවත ශක්තිමත් වීමට අවස්ථාව ලබා දීම එහි සැබෑ අරමුණ විය. 1995 අප්‍රියෙල් මස 11-14 යන දිනවල ෆ්‍රෙන්ඩ්ස් ෆෝ පීස් ඉන් ශ්‍රී ලංකා සංවිධානය මගින් පැවැත් වූ සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ ආරම්භ කර තිබූ යුද්ධ නැවැත්වීමේ සම්මුතිය දිගටම පවත්වා ගෙන යාම ය. රජය අවංකව සම්මුතිය ක්‍රියාත්මක නොකරන බව පවසමින් එහි වාර්තාව මගින් එක් අතකින් රජයට හා හමුදාවට චෝදනා කර ඇති අතර සම්මුතිය නියම අන්දමින් ක්‍රියාත්මක කිරීමට නම් එල්ටීටීය නිල වශයෙන් පිළිගත යුතු යැයි අවධාරණය කර ඇත.[32]

1984 පමණ සිට එල්ටීටීය විසින් ලංකාවේ කරන ලද දරුණු ම්ලේච්ඡ ක්‍රියා අපමණ ය. විරුද්ධ පක්ෂයේ හා වාමාංශිකයින්ගේ අදූරදර්ශී පිළිවෙත් විදේශ කටයුතුභාර අමාත්‍යංශයේ දුර්වල සැලසුම් හා නිලධාරීන්ගේ

අකාර්යක්ෂමතාව, රාජ්‍ය නොවන සංවිධානවල හා ලෝක පල්ලි සම්මේලනයේ මැදිහත් වීම ද යන කරුණු නිසා එම ම්ලේච්ඡ ක්‍රියා ලෝකයට ප්‍රමාණවත් අන්දමින් සන්නිවේදනය කිරීමට ලංකාවට නොහැකි විය. එහෙත් රජීව් ගාන්ධි ඝාතනයත් සමග ඉන්දියාව විසින් සංවිධානාත්මක වෘත්තිමය වූ එල්ටීටීඊ විරෝධි ව්‍යාපාරයක් ගෙන යන ලදී. මේ නිසා එල්ටීටීඊ විරෝධී මතවාදයක් විශේෂයෙන් ම යුරෝපීය පොදු හවුලේ රටවල ද ඇමරිකාව, කැනඩාව, ඇතැම් ස්කැන්ඩිනේවියානු රටවල හා ඔස්ට්‍රේලියාවේ ද ඇති විය. ඒ ඒ රටවලින් එල්ටීටීයට යම් යම් සීමා පැනවීමට පටන් ගත්තේ එහෙයිනි. එය සැබවින් ම එල්ටීටීඊ විරෝධී ප්‍රචාරයක් ලෙස දැන් වර්ධනය වෙමින් පවති. එහෙත්, ජාතිභේදවාදී දේශපාලන මතවාදයේ බිඳ වැටීමක් හැටියට එය සැලකිය නොහැකි ය.

## පා සටහන්

1 Vaikunthavasan, Krishna 1992,*Tamils at the U.N.* , p.6.

2. Wilson, A.J. February, 1987, *Tamil Times*; and 29th January, 1989, *The Times;* Vaikunthavasan, Krishna, 24th July, 1987, 'Sri Lanka Tamils Should Join India' in *New Life.*

3. Hettiaratchi, S.B. 1996, *Tamil Separatist Issue in Sri Lanka and the Devolution Proposals*, p.5.

4. *Tamil Voice International,* 15th March , 1989; 15th May,1989; *London Marusu*, April, 1984.

5. Nehru, Jawaharlal 1969 (reprinted), *The Discovery of India*, p.536.

6. Vaikunthavasan, Krishna, 1992, *Tamils at the U.N.* , p.45.

7. *Ceylon Daily News*, 10th June, 1978; *Ceylon Daily Mirror*, 9th June, 1978; *Sun*, 9th June , 1978.

8. *Island,* 12th May, 1996.

9. Balachandra is a Professor of electrical and electronic engineering, California State University, USA.

10. Vaikunthavasan, Kirishna, 1992, *Tamils at the U.N.*, p.89.

11. *Hansard,* 1939, col.893.

12. Indian Tamil Congress was renamed as Ceylon Workers Congress by S. Thondaman.

13. *Illankai* Tamil Arasu Kachchi which they misnamed Federal Party for the purpose of their real intention. *viz.,* separation.

14. Vaikunthavasan, Krishna 1992, *Tamils at the U.N.*, p. 31.

15. Piyasena, S. and Senadheera, R.Y. 1987, *India, We Tamils and Sri Lanka*, p.107.

16. *The Ethnic Problem in Sri Lanka*, A collection of Essays, by Overseas Sri Lankans' Organization for National Unity, 1986, p.41,

17. He was the first Tamil Cabinet Minister after Sir John Kotelawala's Cabinet.

18. The work referred to under 16, pp.41ff.

19. *Sunday Times*, 5th May, 1975.

20. Letter dated 14th June, 1976 sent by David Astor to acknoweldge the funds received by their organization from Vaikunthavasan.

21. The text of the speech is as follows:

"Mr President, leaders of the world, if oppressed minority nations, such as Thamil Eelam cannot make representations to this supreme body, then where are we to go?

"My name is Krishna and I come from a 2 1/2 million strong nation of Thamil Eelam lying between Sri Lanka and India.

"The Sri Lanka government is continuing a policy of genocide aimed at the destruction of the Thamil nation.

"We have exercised our right of self determination; to live as a separate nation.

"There is every danger of the Thamil problem threatening the peace of the Indian region.

"The problem in Sri Lanka will develop to be as serious as the Palestinian and Cyprus unless you, the world leaders, intervene, and help in its solution now. We appeal to you for such help.

"Thank you. I apologise for speaking without permission."

Hameed quipped in lighter vein: "I wish to thank the previous speaker who tried to steal my opportunity". *Sun,* 7th October, 1978.

22. *The Independent Weekly*, 4th October, 1979.

23. A Ministry of State Publication, *The Facts:* This booklet contains a statement made by Sri Lankan Ambassador Tissa Jayakoddy in Geneva on 22nd August , 1983, to the United Nations, Sub-Commission on the Prevention of Discrimination and Protection of Minorities.

24. *ibid*, Col. 9.

25. *Hansard,* 1986, 20th February, p.32.

26. Piyasena, S. and Senadheera, R.Y. *India, 'We Tamils' and Sri Lanka*, Delhi, 1987, pp. 126-127. See also Athulathmudali, Lalith *The Eastern Province: the Crux of the problem*: the book contains the speech made by Hon. Lalith Athulathmudali on 23rd August, 1990 in Parliament and the article entitled "Ethno-Regionalism as a Basic for Geographical Separation in Sri Lanka" by Vidyamali Samarasinghe.

27. *Sunday Leader*, 8th January, 1995.

28. Funding Terror: LTTE and their Criminal Activities in Canada and the Western World in *Sri Lankan Overseas,* vol. 1, issue 3, April-June, 1996; රිරියගොල්ල, ගාමිණී දෙමළ ත්‍රස්තවාදය හා ජගත් ප්‍රතිපත්ති, *දිවයින*, 11 මැයි, 1996.

29. Wider: Research for Action Towards a Peaceful Sri Lanka, (editor ) Carlo Fonseka, 1990, pp. 109ff.

30. *Times of India*, 2nd July, 1991.

31. Vide also Perera, Clem "Will the Tiger Changes its Stripes for a Lady?" in the *Sunday Leader*, 8th Junuary, 1995.

32. *Brief Narrative Report:* "... although the Government has declared that it has lifted the sanctions on most of the banned items people from within Jaffna Peninsula reported that the lifting of embargo although given wide publicity in the South (*sic*) in fact had not really been given effect,... the corrupt officers of the army were making a lot of money through bribes ... Notwith standing the above inhibitions and constraints however, the whole group felt that if the LTTE is given an officially recognized share in the restoration measures things would improve automatically".

සිතියම් අංක 1

# THE WAY OUT FOR THE TAMIL SPEAKING PEOPLE

## INDO - CEYLON FEDERATION

MORE TAMILS INTO BRITAIN?





**JOINTLY PUBLISHED BY EALEM TAMILS ASSOCIATION, 919, GARRATT LANE, TOOTING, LONDON SW17,and the ILANKAI THAMIL SANGAM, 89 TENNYSON DRIVE, NANUET,**
**NEW YORK,10954. for the INDO-CEYLON**
**FEDERATION MOVEMENT, 55 WARREN ROAD,**
**COLLIERS WOOD, LONDON SW19.**
**By**
**KRISHNA VAIKUNTHAVASAN,**
**2 STONE BUILDINGS, LINCOLN'S INN,**
**LONDON WC2A 3TA**

සටහන- උතුරු ඉන්දියාවේ ගරිල්ලා පුහුණු මධ්‍යස්ථාන


## MILTARY TRAINING IN NORTH INDIA

| Groups | No. trained | Period of training | Location of camp | Subject of instructions | Name of instructors |
|---|---|---|---|---|---|
| TELO | Not Known | 13.08.83<br>18.02.84 | Aplace in proximity to Greater Kailas 11. in New Delhi | SMGG, AK 47, Revolver,Explosives | 'Sir', an indian who conversed in Hindi.Nayar of Kerala |
| TELO | Not Known | 30.10.83<br>19.07.84 | Sadtagen Development area adjoing Cannal Park in New Delhi.(3 moths training) | Manufacturing of bombs, handling of SMGG, AK 47, pistolst | Narayan and 2 others of the Indian government |
| Recruits for training at all camps are sent in batches of 90. | | | | | |
| TELO | 300 | 26.09.83<br>25.09.83 | At a location about 2 hours journey by bus from New Delhi railway station | PT, SLR, AK 47 Weapon handling, Guerrilla warafare, Firing practice, Grenade throwing, Rocket launcher | North Indians |
| TELO | 102<br>60<br>150 | 12.10.83<br>03.10.84 | A camp in Uttar Pradesh close to Himalayan foothills | PT, Weapon training, Jungle warfare, Map reading, Military lactics, Communications | One Punjab national, 3 Malayalees and 7 other instructors |
| TELO | 60 | 20.10.83<br>03.02.84 | Green Park, New Delhi, close to the medical college | Trained in using pistols, revolvers, and SMG, firing practice | Narayan and 3 instructors from Kerala |
| TELO | Not Known<br>19.06.84 | 19.10.83<br>from Himalayan foothills | A camp in Uttar Pradesh not far | Physical training, Weapon training, Jingle warfare, Map reading, Military tactics, Communications | Indian instructors |
| PLOT | Not Known | 21.05.83<br>Data of completion not known | The Army Camp close to the Internationl Airport, Delhi | Drill, Weapontraining | Rajah, retired army soldier, Shekar, Indian army soldier, |
| EROS | 56 | 05.10.83<br>21.03.84 | A camp in Uttar Pradesh close to foothils of Himalaya | Drill, Weapon training, Map reading, communications. Fleld craft. Guerrilla warfare. Military tactics | Indian instructors |

සිතියම් අංක 2-3




Eelam as claimed by the "Eelam Tamil Association (Australasia)" on the cover of a booklet issued for its New Year Celebration, 14th April, 1984, at Strathfield Girls High School.




Eelam claimed as "our birthright" by the "Eelam Tamils Association of America (Somerville, Mass, USA)" in a paid advertisement in a Pan Am Calendar for June, 1984.

ඉන්දීය රජය විසින් එල්ටීටීය තහනම් කිරීම සඳහා මෑතකදී පළකළ ගැසට් නිවේදනය. (එය පළමුවෙන් ම තහනම් කරනු ලැබුවේ රජීව් ගාන්ධි ඝාතනය කළ විගසම ය. එහෙත්, ලංකා රජය තවමත් එය තහනම් කොට නැත.)

**The Gazette of India**

## EXTRAORDINARY

**PART II — Section 3 - Sub Section (ii)**

No.276, NEW DELHI,TUESDAY, MAY 14, 1996/VAIŚAKHA 24,1918

## MINISTRY OF HOME AFFAIRS

## NOTIFICATION

**New Delhi, the 14 th May, 1996**

S.O.338(E).- whereas the Liberation Tigers of Tamil Eelam (hereinafter referred to as LTTE), is an association actually based in Sri Lanka but having sympathisers, supporters and agents on Indian Soil;

2. And whereas LTTE's objective for a homeland for all Tamils disrupts the sovereignty and territorial integrity of India and thus falls within the ambit of an unlawful activity;

3. And whereas the continuing millitant pursuit by the LTTE of objective of a separate homeland (Tamil Eelam) for all Tamils, threatens the sovereignty and territorial integrity of India;

4. And whereas most of the criminal cases involving LTTE, and pro-groups like TNRT (Tamil National Retrieval Troops) and Tamil Pasarai, such as the Rajiv Gandhi Assassination Case, the Padmanabha Murder Case and the cases involving TNRT and Tamilar Pasarai etc, are still under trial and the sympathy for the 'Tamil Eelam' concept still remains among the pro-LTTE groups in Tamil Nadu and the forces are still at work to further its cause, thereby contributing to the said highly vulnerable millieu in which LTTE's free functioning in India as a lawful association, if allowed, is likely to be highily detimental to the sovereignty and territorial integrity of India;

5. And whereas LTTE continues to be a strong terrorist force in Sri Lanka, which continues to remain in a state of ethnic strife and the demand of Tamil Eelam finds a strong echo in Tamil Nadu due to the linguistic, cultural, ethnic and historical affinity between the Sri Lankan Tamils and the Indian Tamils in Tamil Nadu, the separatist Tamil chauvinist forces in Tamil

Nadu and the pro-LTTE groups are trying to stimulate the secessionist sentiment to enhance the support base of the LTTE in 'Tamil Nadu', which are likely to have a strong disintegrating influence over the territorial integrity of India,

6. And whereas the Central Government is of the opinion that for the reasons aforesaid, the LTTE is an unlawful association;

7. And whereas the Central Government has information that:

(a) LTTE in Tamil Nadu has persisted with its violent and disruptive activities prejudicial to the integrity and sovereignty of India. The presence of LTTE in India helped escape of 43 cadres from the Special Camp at Vellore on 14/15-08-1995. On April 16.1996 one Muthukumar belonging to TNRT was arrested by state police from a coastal village Menamelkudi (Pudukottai District). He has revealed that he was responsible for arranging sailings for the LTTE escapees of Vellore Camp on 14/15-8-1995. His arrest confirms the presence of LTTE supporters in Tamil Nadu who are engaged in subversive activities.

(b) There was also a bomb attack in the office of the Sri Lankan Deputy High Commissioner at Madras on 11-9-1995 by Tamil Nadu Liberation Army (TNLA) – a pro-LTTE extremist group.

(c) LTTE continues to adopt a strong anti- India posture and continues to pose a grave threat to the security of the Indian VVIPs, including the Prime Minister of India, and its utterances are inciting the secessionist forces in Tamil Nadu. Lawrence Thilagar, an LTTE spokesman, based in Paris, has even alleged on 30-11-1995 that the Indian Government was 'covertly' supporting the Sri Lankan Army in its millitary offensive in Jaffna.

(d) Arms and ammunitions continue to be seized from LTTE and pro-LTTE groups–last such incident took place on 17-4-1996. Cases have been registered under the Arms Act,1959 and the Explosive Substances Act,1908.

(e) In an incident on April 22, 1996, some unidentified persons belonging to TNLA, threw country made bombs at the TV Relay Station at Uluthukuppai Maileduthurai (NQH District). Posters recovered from the site hailed the Liberation of Tamil Nadu.

(f) In another incident on April 22,1996, 4 unidentified persons threw country-made bombs into Perani Railway Master's room (VRP District) after forcibly removing the Station Master, causing damage to railway equipment. Handwritten postes found on the Station premises expressed support for Tamil Eelam and advocated separate Tamil Nadu. The posters also urged the people to boycott general electoins.

8. And whereas the Central Government is of the opinion that the aforesaid activitives of the LTTE continue to pose threat to and are detrimental to the sovereignty and integrity of India as also public order;

9. And whereas the Central Government is futher of the opinion that (i) because of its continued violent and disruptive activities prejudicial to the integrity and sovereignty of India and because (ii) it continues to adopt a strong anti-India posture and also continues to pose a grave threat to the security of Indian Nationals; it is necessary to declare the LTTE as an unlawful association with immediate effect;

10. Now, therefore, in exercise of the powers conferred by sub section (1) of Section 3 of the Unlawful Activities (Prevention) Act, 1967 (37 of 1967), the Central Government hereby declaers the Liberation Tigers of Tamil Eelam to be an unlawful association and directs, in exercise of the powers conferred by the proviso to sub-section (3) of that Section, that this notification shall, subject to any order that may be made under Section 4 of the said Act have immediate effect and will remain in force for a period of 2 months from the date of its publication in the Official Gazette.

**(F.No.1-11034/9/96-1 SDI (A)**
**S. PRAKASH. Jt. Secy.**